# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,895 — 1970 පෙබරවාරි 27 වැනි සිකුරාද — 1970.2.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටයකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 199 | ආදයම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| සනතුරු-ඇබෑර්තු ... ... ... | 203 | අය-වැය ලේඛන ... ... ... | 212 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 207 | දේපල විකිණීම් ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 210 | මාර්ග කොමිටි දන්වීම් ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දන්වීම් ... | — | විවිධ දන්වීම් ... ... ... ... | 213 |



## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.—බී. 67/36

### මාවනැල්ල සුළු නගර සභාව

#### ප්‍රසිද්ධ රඟ දක්වීමේ ආඥපනත

ප්‍රසිද්ධ රඟ දක්වීම් ආඥපනතේ (176 වැනි අධිකාරය) 3 වැනි වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් පනවනු ලැබූ ව්‍යවස්ථාව.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි 7 දින,
කොළඹ දීය.

#### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දක්වීම් ආඥපනතේ 3 වැනි වගන්තිය යටතේ පනවා 1919 අප්‍රේල් මස 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1943 අප්‍රේල් මස 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ ව්‍යවස්ථාවෙන් සංශෝධිත, ව්‍යවස්ථාවල අංක අ.3 දරන ව්‍යවස්ථාව වෙනුවට පහත දක්වෙන ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් මාවනැල්ල සුළු නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයට අදාළ වන තාක් දුර ඒ ව්‍යවස්ථා තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

### විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටයකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයෙ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

199—5 69637—5,142 (70/2)

"අ.3—ගෙවීමක් පිට තැනැත්තන් ඇතුළු කරනු ලබන ප්‍රසිද්ධ රඟ දැක්වීම් පැවැත්වීමේ කාර්‍ය්‍ය සඳහා යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් හෝ ඉදිකිරීමක් සම්බන්ධයෙන් බලපත්‍රයක් ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවකු විසින් ම බලපත්‍රය නිකුත් කිරීමට ප්‍රථම මෙහි වූ උපලේඛනයේ නියමිත ගාස්තු සභාවට ගෙවිය යුතුය.

| | එක් දිනකට | | එක් මසකට | | (දෙසැ. 31 වැනිදින් අවසන් වන) එක් වර්ෂයකට | |
|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 ට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 ... | 20 | 0 ... | 100 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 199 ට වැඩි නමුත් 399 ට වැඩි නොවන කල්හි ... | 10 | 0 ... | 40 | 0 ... | 200 | 0 |
| ආසන පහසුකම් සැපයෙන තැනැත්තන්ගේ ගණන 399 ට වැඩි කල්හි... ... ... | 15 | 0 ... | 60 | 0 ... | 350 | 0 |

2–1103—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී. 67/36

## ලුණුගල සුළු නගර සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන අමාත්‍යවරයා විසින් පනවන ලද ව්‍යවස්ථාවයි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970 පෙබරවාරි මස 7 දින,
කොළඹ දී ය.

### ව්‍යවස්ථාව

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ සම්පාදිතව, 1919 අප්‍රේල් මස 4 වැනි දින අංක 7,004 දරන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 1943 අප්‍රේල් මස 9 වැනි දින අංක 9,108 දරන ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද ව්‍යවස්ථාවෙන් අන්තිමට සංශෝධිත ව්‍යවස්ථා ලුණුගල සුළු නගර සභා සීමා ඇතුළත වූ ප්‍රදේශයට අදාළ වන තාක් එහි අ (3) වැනි ව්‍යවස්ථාවේ දක්වා ඇති ගාස්තු ක්‍රමය වෙනුවට පහත සඳහන් අලුත් ගාස්තු ක්‍රමය ආදේශ කිරීමෙන් ඒවා තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

| | දින 9ට වැඩි නොවන කාලයකට (දිනකට ගාස්තු) | | දින 9ට වැඩි එහෙත් මාසයකට වැඩි නොවන කාලයකට ගාස්තු | | මාස 1 සිට මාස 6 දක්වා ගාස්තු | | මාස 7 සිට මාස 10 දක්වා ගාස්තු | | මාස 10 සිට අවුරුද්ද දක්වා ගාස්තු | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පනවනු ලැබ ඇති තැනැත්තන්ගේ ගණන 199ට වැඩි නොවන විට ... | 3 | 0 ... | 15 | 0 ... | 30 | 0 ... | 60 | 0 ... | 100 | 0 |
| ආසන පනවනු ලැබ ඇති තැනැත්තන්ගේ ගණන 199ට වැඩි එහෙත් 399ට වැඩි නොවන විට ... ... ... | 5 | 0 ... | 25 | 0 ... | 50 | 0 ... | 100 | 0 ... | 125 | 0 |
| ආසන පනවනු ලැබ ඇති තැනැත්තන්ගේ ගණන 399ට වැඩිවන විට ... | 10 | 0 ... | 50 | 0 ... | 75 | 0 ... | 125 | 0 ... | 150 | 0 |

2–1104—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

එල්.ඩී.—බී. 47/45.

### සුසාන භූමි හා භූමදාන ආඥාපනත

(231 වැනි අධිකාරය වන) සුසාන භූමි හා භූමදාන ආඥාපනතේ 5 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමති, රණසිංහ ප්‍රේමදාස වන මම, මෙහි වූ උපලේඛනයේ වඩාත් සවිස්තර ව ඇති, හැටන්-දික්ඔය නගර සභා පරිපාලන සීමා ඇතුළත මරණයට පත් වන්නන් භූමදාන කිරීම හෝ ආදාහන කිරීම සඳහා ඉහත කී සීමා ඇතුළත පිහිටි දරවැල්ලේ පොදු සුසාන භූමියක් මෙයින් පිහිටුවමි.

ආර්. ප්‍රේමදාස,
පළාත් පාලන ඇමති.

1970.2.7 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ අඹගමු කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයට අයත් දික්ඔය ග්‍රාමසේවක වසමේ සහ හැටන්-දික්ඔය නගර සභා පරිපාලන සීමා තුළ—

උතුරට : එම ඉඩමේ ඉතිරි කොටසින් ;

නැගෙනහිරට : එම ඉඩමේ ඉතිරි කොටසින් හා දරවැල්ල වත්තේ සුසාන භූමියට පිවිසීමට ඇති අඩි පාරින් ;

දකුණට : දික්ඔයේ සිට පිලරි දක්වා ඇති රජයේ වැව දෙපාර්තමේන්තුවේ ප්‍රසිද්ධ පාරින් හා ;

බටහිරට : එම ඉඩමේ ඉතිරි කොටසින් ද මායිම් වූ දරවැල්ල වත්තෙන් අක්කර දෙකක (අක්කර 2, රූඩ් 0, පර්චස් 0) ප්‍රමාණයේ මුළු ඉඩම් කොටස වේ.

2–1101—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී 11/51

ඇල්.ජී.ඩී./ඒ/විසී/ඩී/4/1.

### ගෝඝාතක ආඥාපනත

(272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනතේ 27 වැනි වගන්තිය යටතේ නිසි බලධරයා විසින්, එනම් මන්නාරම දිස්ත්‍රික්කයේ ඉරුක්කාලම්පිඩ් ගම් සභාව විසින් පනවනු ලැබ, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් ස්ථිර කරන ලද නියෝග.

ජී. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 12,
කොළඹ දී ය.

### නියෝග

1. ගෝ ඝාතක ආඥාපනත යටතේ ප්‍රකාශ කරන ලද පොදු ගෝ ඝාතක ස්ථානය සෞඛ්‍ය වෛද්‍ය නිලධරයාගේ හෝ ඔහු විසින් ඒ සඳහා බලය පවරන ලද යම් මහජන සෞඛ්‍ය පරීක්ෂකයකුගේ භාරයේ තිබිය යුතුය. එකී ගෝ ඝාතක ස්ථානය ඇතුළත මනා පරිපාලනය හා සනීපාරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් ඒ නිලධරයා විසින් වගකිය යුතුය.

2. (1) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—

(අ) සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා විසින් හෝ ඒ සඳහා සභාපති විසින් පත් කරන ලද නිලධරයකු විසින් ඒ සතා පරීක්ෂා කොට මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර තිබේ නම් මිස, හෝ

(ආ) යම් දිනයක පූ. භා. 8 ටත්, දහවල් 12 ටත් අතර කාලයේ දී, මිස ගෝ ඝාතක ස්ථානයේ දී නොමැරිය යුතුය. එහෙත් විශේෂ අවස්ථාවකදී මෙහි සඳහන් වේලාවට වෙනස් වූ යම් වේලාවක යම් සතෙකු මැරීම සඳහා සභාපති විසින් බලය දිය හැකිය.

(2) කිසිම තැනැත්තකු විසින් කිසිම සතෙකු—

(අ) (1) වැනි ඡේදය යටතේ ඒ සතා මැරීම සඳහා අනුමත කළ වේලාවේ සිට පැය 30 ක කාලයක් ගත වූවාට පසු යම් වේලාවක, හෝ

(ආ) (1) වැනි ඡේදය යටතේ අනුමත කළාට පසු ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙන් පණ පිටින් ඉවත් කර ඇත්තේ නම්, ඒ සතා නැවතත් පරීක්ෂා කොට මනුෂ්‍ය ආහාරය පිණිස මැරීම සුදුසු යයි එම ඡේදය යටතේ අනුමත කරන ලද්දේ නම් මිස, ගෝ ඝාතක ස්ථානයේ දී නොමැරිය යුතුය.

3. ගෝ ඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තකු විසින්ම ඒ සතා ගෝ ඝාතක ස්ථානයට අයිති භූමියෙහි නවත්වා තබන කාලය තුළ ඒ සතාට සෑහෙන පරිදි කෑම බීම නිසැකව ලැබීම සඳහා අවශ්‍ය වූ සෑම විධිවිධානයක්ම යෙදිය යුතුය.

4. ගෝ ඝාතක ස්ථානයට යම් සතකු ගෙන එන සෑම තැනැත්තෙකු විසින් ඒ සතා මැරීමට සුදුසු නැතැයි ප්‍රතික්ෂේප කරන ලද්දේ නම් එසේ ප්‍රතික්ෂේප කළ වහාම ඒ සතා ඒ ස්ථානය පිහිටි භූමියෙන් ඉවත් කළ යුතුය. නැතහොත් ඉවත් කරවිය යුතුය.

5. යම් සතකු 2 වෙනි නියෝගය යටතේ මැරීමට සුදුසු යයි අනුමත කළාට පසු ඒ සතා ලෙඩ සහිත බව හෝ මිනිසුන්ට ආහාර පිණිස මැරීම නුසුදුසු බව පෙනී ගියහොත් 2 වැනි නියෝගයෙහි සඳහන් යම් නිලධරයකු විසින් ඒ සතා මැරීම තහනම් කළ හැකිය.

6. ගෝ ඝාතක ස්ථානයේ දී මරන ලද යම් සතකුගේ මස් හෝ අතුනුබහන් ආදිය 2 වැනි නියෝගයේ සඳහන් වූ යම් නිලධරයකුගේ කල්පනාවේ හැටියට ලෙඩ සහිතව හෝ මිනිසුන්ගේ ආහාරයට නුසුදුසුව තිබේ නම් ඔහු විසින් ඒ මස හෝ අතුනුබහන් ආදිය වහාම විනාශ කර දැමීමට සැලැස්විය යුතුයි. එසේ නැතහොත් ඒ මස් හෝ අතුනුබහන් ආදිය විකිණීම පිණිස තැබීම හෝ මිනිසුන් විසින් ආහාර පිණිස ගැනීම වළකින අන්දමින් ඉවත් කරවීම හෝ කළ යුතුය.

7. ගෝ ඝාතක ස්ථානය භාරවූ නිලධරයා විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස මැරීම සුදුසු යයි අනුමත කර නැත්තාවූ හෝ 5 වැනි නියෝගයේ විධිවිධාන පරිදි මැරීම තහනම් කර තිබෙන්නාවූ කිසිම සතකු මැරීමට අවසර නොදිය යුතුය.

8. (1) කිසිම තැනැත්තකු විසින් මිනිසුන්ගේ ආහාරයට නුසුදුසු යයි 6 වැනි නියෝගය යටතේ ප්‍රකාශ කරන ලද කිසිම මසක් හෝ අතුනුබහන් ආදියක් 2 වැනි නියෝගයෙහි සඳහන් වූ යම් නිලධරයකුගේ නියමය යටතේ මිස ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

(2) කිසිම තැනැත්තෙකු විසින් මිනිසුන්ගේ ආහාරය පිණිස අදහස් කරන ලද යම් සතකුගේ කුණපය, ඒ කුණපයේ ඉස්සරහ ගාත්වලත් පස්සං ගාත්වලත් ගෝ ඝාතක ස්ථානය භාරවූ නිලධරයා විසින් "ඉ. ග. ස." යන සලකුණ හා අවස්ථාවෝචිත පරිදි ගවමස් හෝ එළුමස් යන වචන සමග මුද්‍රා තබා තිබේ නම් මිස නැත්නම් ගෝ ඝාතක ස්ථානයෙන් ඉවත් නොකළ යුතුය.

9. අනික් සතුන් ඉදිරියේ දී හෝ ඒ ස්ථානයෙහි කලින් මරන ලද, යම් සතෙකුගේ කුණපය ඒ ස්ථානයෙන් ඉවත් කර හෝ මුවා කර, ස්ථානය ශුද්ධ පවිත්‍ර කරන තුරු හෝ කිසිම සතකු නොමැරිය යුතුයි.

10. (1) මෙහි මින්මතු විධිවිධාන යොදා ඇති ආකාරයට යටත්ව ගෝ ඝාතක ස්ථානය පාවිච්චි කිරීම සඳහා පහත සඳහන් ප්‍රමාණයන් අනුව ගාස්තුවක් අය කළ යුතුය.

| | රු. | ශ. |
|---|---|---|
| ගරකුන් සඳහා එකකුට ... | 1 | 50 |
| බැටළුවන් හෝ එළුවන් සඳහා එකකුට ... | 1 | 00 |

එසේ වුවද යම් ගෝ ඝාතක ස්ථානයට ගෙන එන ලදුව මැරීම සඳහා නුසුදුසු යයි ප්‍රතික්ෂේප කරනු ලැබූ හෝ මැරීමෙන් ඉවත් කරනු ලැබූ විට ඒ සතා සම්බන්ධයෙන් අය කළ යුතු ගාස්තුව ශත 50 පමණක් විය යුතුය.

(2) (1) වැනි ඡේදයේ නියමිත ගාස්තුව එකී සතා සම්බන්ධයෙන් සභාවට ගෙවා එකී ගාස්තුව ගෙවූ බවට ලබා ගත් නීත්‍යානුකූල වූ කුවිතාන්සිය ගෝ ඝාතන ස්ථානය භාරකාරයා වෙත හෝ එකී කුවිතාන්සිය ඉදිරිපත් කර සිටිය යුතු අය වශයෙන් සභාපති විසින් ලියවිල්ලකින් පත් කළ හැකි වෙනත් නිලධාරියෙකු වෙත එය ඉදිරිපත් කරනතුරු ගෝ ඝාතක ස්ථානය තුළ සතුන් මැරීම හෝ එම ස්ථානයෙන් සතුන් ඉවත් කිරීම හෝ නොකළ යුතුය.

11. (1) ගෝ ඝාතක ස්ථානය භාරකරු විසින් ගෝ ඝාතක ස්ථානයේ මරනු ලබන සියලුම ගවයන්ගේ නාම ලේඛනයක් ද, සියලුම එළුවන්ගේ හා බැටළුවන්ගේ නාම ලේඛනයක් ද තබා ගත යුතුය.

(2) ඒ නාම ලේඛනය මෙයට යාකොට ඇති උපලේඛනයෙහි සඳහන් ආකෘතිය සාරානුකූලව විය යුතුය.

12. මේ නියෝගවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යනුවෙන් ඉරුක්කාලම්පිඩි ගම් සභාව අදහස් වේ.

"සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා" යනුවෙන් මන්නාරම සෞඛ්‍යය වෛද්‍ය නිරධරයා අදහස් වේ.

"ආඥාපනත" යනුවෙන් (272 වැනි අධිකාරය වන) ගෝ ඝාතක ආඥාපනත අදහස් වේ.

## උපලේඛනය

ගව කුවිතාන්සියේ අංකය :————.

විස්තර :————.

පාට :—

වයස :————.

දකුණු පැත්ත, වම් පැත්ත සහ ලකුණු :————.

ගෝ ඝාතකයාගේ නම :————.

ගරක් කොටුවට ඇතුළු කළ වේලාව සහ දිනය :————.

පරීක්ෂා කර බැලූ දිනය :————.

මරණ දිනය :————.

ගරක් බාරගන්නා නිලධාරියාගේ කෙටි අත්සන :————.

වැඩිපුර කරුණු :————.

2-1079—දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී.—බී.70/44.

## නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත

1969.12.3 වෙනි දින පැවති රැස්වීමක දී උත්තර මන්ත්‍රී මණ්ඩලය විසින් ද, 1969.12.20 වෙනි දින පැවැති රැස්වීමක දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් ද සම්මත කර ගනු ලැබූ පහත සඳහන් යෝජනාව මහජනයාගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධ කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
සථිර ලේකම්.

1970.2.8.
කොළඹ.

### යෝජනාව

"(268 වෙනි අධිකාරය වන) නිවාස සහ නගර සංවර්ධන ආඥාපනත මීට යාකොට ඇති උපලේඛනයෙහි විස්තර කරනු ලබන ප්‍රදේශය තුළ, 1969.12.1 වැනි දින සිට, ක්‍රියාත්මක විය යුතු යයි එකී ආඥාපනතේ 3(ආ) වගන්තියෙහි විධිවිධාන යටතේ මෙම සභාව යෝජනා කරයි:—

## උපලේඛනය

උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ නුවරගම පලාත—බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශයට අයත් විලච්චිය කෝරළේ නොච්චියගම ග්‍රාමයෙහි පිහිටි පහත සඳහන් පරිදි මායිම් වූ සියළු බිම් ප්‍රදේශය :—

උතුරට : අනුරාධපුර-පුත්තලම පාරේ, 31 වැනි සැතපුම් කණුවේ සිට එම පාරේ මධ්‍ය රේඛාවට ලම්බකව වැටෙන සේ උතුරු දෙසට යාර 350 ක් දුරට අඳින ලද රේඛාවක කෙළවරේ

ලක්ෂ්‍යයෙන් පටන් ගෙන, එම මධ්‍ය රේඛාවට යාර 350 ක දුරින් හා ඊට සමාන්තරව ඊශාන දෙසට අඳින ලද රේඛාවක්, එය එම පාරේ 33 වැනි සැතපුම් කණුවේ සිට එහි මධ්‍ය රේඛාවට ලම්බකව උතුරු දෙසට අඳින ලද අන්‍ය රේඛාවක් හමුවන ලක්ෂ්‍යය දක්වා.

නැගෙනහිරට: අවසාන වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ගිණිකොණ දෙසට ඉහත සඳහන් ලම්බක රේඛාව ඔස්සේ 33 වෙනි සැතපුම් කණුවේදී එකී පාර හරහා ගොස් එකී පාරේ මධ්‍ය රේඛාවක් එකී ලම්බක රේඛාවත් එකිනෙක කැපෙන ලක්ෂ්‍යයේ සිට යාර 350 ක් දුරින් පිහිටි ලක්ෂ්‍යයක් දක්වා ද,

දකුණට: අවසාන වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට අනුරාධපුර-පුත්තලම පාරේ මධ්‍ය රේඛාවට යාර 350 ක් දුරින් හා එයට සමාන්තරව නිරිත දෙසට අඳින ලද රේඛාවක් එම පාරේ 31 වැනි සැතපුම් කණුවේ සිට එම මධ්‍ය රේඛාවට ලම්බකව දකුණු දෙසට ඇඳි අන්‍ය රේඛාවක් හමුවන ලක්ෂ්‍යය දක්වා ද,

බටහිරට: අවසාන වරට සඳහන් කරන ලද ලක්ෂ්‍යයේ සිට ඉහත සඳහන් ලම්බකය ඔස්සේ වයඹ දෙසට 31 වෙනි සැතපුම් කණුවේ දී එම පාර හරහා ගොස් ප්‍රදේශයේ උතුරු මායිමේ ආරම්භක ලක්ෂ්‍යය දක්වා ද වේ."

2-1102—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

එල්.ජී.—බී. 27/47.

## රක්වාන සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහා වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය) සුළු නගර සභා ආඥාපනතෙහි 129 (ආ) වැනි වගන්තිය යටතේ සහ ඒ වගන්තිය ප්‍රකාර දෙන ලද පළාත් පාලන ඇමතිවරයාගේ අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමාකිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, රක්වාන නගරය තුළ පිහිටි සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමින් සියයට තුන බැගින් වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක්, පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසාන කළ හැකි අන්දමට 1970 වර්ෂය සඳහා රක්වාන සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි මස 8 වෙනි දින,
කොළඹ දීය.

2-1093—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## වත්තේගම නගර සභාව

### නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහාවූ විශෙෂ ජලබද්ද

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 130 (ආ) වැනි වගන්තිය යටතේ සහ එම වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව වත්තේගම නගර සභාවේ පාලන සීමා තුළ පිහිටි කුඹුරු නොවන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් ජල බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි වනසේ 1970 වර්ෂය සඳහා වත්තේගම නගර සභාව විසින් පනවා තිබෙන බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 2. 8 දින,
කොළඹ දීය.

2-1091—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ජී.—බී. 139/46.

## විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ උතුරු බිත්තැන්න ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ එම වගන්තියේ 2 වැනි උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මේ ගම්සභාව විසින් එහි පරිපාලන සීමාව ඇතුළත පැවැත්වෙන (එකී ආඥාපනතේ විස්තර කර ඇති පරිදි) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අයකරනු ලබන ගෙවීම්වලින් පහත සඳහන් ප්‍රමාණයන් අනුව වූ බද්දක්, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවෙන දින සිට පනවා අයකරනු ලැබේ.

### ගෙවිය යුතු මුදල් ප්‍රමාණය

ඇතුළුවීම සඳහා ගෙවනු ලබන මුදලට බදු මුදල ඇතුළත් නොවන අවස්ථාවන් හිදී—

| | බදු ප්‍රමාණය රු. ශත |
|---|---|
| (අ) ශත 20 කට අඩු නොවන නමුත් ශත 50 කට වැඩි නොවන විට ... ... ... | 0 05 |
| (ආ) ශත 50 කට අඩු නොවන නමුත් රු. 1 කට වැඩි නොවන විට ... ... ... | 0 10 |
| (ඇ) රු. 1 කට අඩු නොවන නමුත් රු. 1.50 කට වැඩි නොවන විට ... ... ... | 0 15 |
| (ඈ) රු. 1.50 කට අඩු නොවන නමුත් රු. 2 කට වැඩි නොවන විට ... ... ... | 0 20 |
| (ඉ) රු. 2 කට අඩු නොවන නමුත් රු. 3 කට වැඩි නොවන විට ... ... ... | 0 30 |
| (ඊ) රු. 3 කට අඩු නොවන නමුත් රු. 5 කට වැඩි නොවන විට ... ... ... | 0 40 |
| (උ) රු. 5 කට වැඩි වන විට ගෙවන මුදලෙන් සියයට 25 ක්. | |

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970. 2. 8 වන දින,
කොළඹ දීය.

2-1089—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

එල්.ජී.—බී. 19/50.

## පුස්සැල්ලාව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1970 වර්ෂය සඳහාවූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතෙහි 129 (ආ) වැනි වගන්තිය යටතේ හා ඒ වගන්තිය යටතේ දෙනු ලැබූ පළාත් පාලන ඇමතිවරයාගේ අනුමතිය ඇතිව, අතුරු ව්‍යවස්ථාවලින් නියම කළ හැකි සීමා කිරීම් හා නිදහස් කිරීම්වලට යටත්ව, පුස්සැල්ලාව නගරය තුළ පිහිටි සියළුම නිශ්චල දේපළවල වාර්ෂික වටිනාකමෙන් සියයට හය බැගින්වූ ජලය පිළිබඳ විශේෂ වරිපනම් බද්දක් පිළිවෙළින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවිය හැකි අන්දමට 1970 වර්ෂය සඳහා පුස්සැල්ලාව සුළු නගර සභාව විසින් පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. ජී. ගුණවර්ධන,
ස්ථිර ලේකම්,
පළාත් පාලන අමාත්‍යාංශය.

1970 පෙබරවාරි මස 8 වැනි දින,
කොළඹ දීය.

2-1092—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

(පහත සඳහන් (iii) (අ), (ආ) සහ (v) දරන කොන්දේසි දෙමළ/ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් සේවයට බඳවා ගනු ලැබූවන් කෙරෙහි යෙදෙයි.)

සටහන 1.—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

සටහන 2.—රජයේ සේවයෙහි නියැලිව සිට පළාත් පාලන සේවයේ තනතුරු භාර ගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නා වූ "ආදි ප්‍රවේශක නිළධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) (අ), (ආ) සහ (ඇ) හි සඳහන් විධිවිධාන අදළ නොවේ.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ද, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචිකරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

6. **සේවා මුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවා මුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය හට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම් කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම් ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙනා පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරන වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බල මණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

8. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුව හොත් ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදනම්ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාරියෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත්, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී, ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූද ඒ අවදානමට මුහුණ පාති.

**අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත් ආකෘතිය**

## පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම්පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත් අයදුම්කරුවෝ ස්වකීය අයදුම්පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළ වන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

**————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————
   (ආ) ඉල්ලුම් කර සිටින තනතුර :————.

2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
   ජාතිය :————.
   (එම ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න)

3. තැපැල් ලිපිනය :————.
   (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)

4. (අ) අයදුම්පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස: අවුරුදු :————, මාස :————, දින :————.
   (ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :————.
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පියා සහ මුත්තා :————.
   (අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙනගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයක් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතන වල නම් :————.

10. ඉගෙන ගත් පාඨශාලා හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) : ————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාලසීමාවන් :————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හට යක් නම් :
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම් ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛන ගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මෙ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත් මා නුසුදුස් සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
සභාපති,
තැපැල් පෙට්ටිය 530, කොළඹ 1.

---

## පළාත් පාලන සේවය— පශු පරීක්ෂක තනතුර

පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් පශු පරීක්ෂක තනතුරක් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වාර්ෂික වැටුප් ක්‍රමය රු. 3,576—144×15—රු. 5,736 කි. මෙහි රු. 4,584 වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිමකි.

3. අවශ්‍ය සුදුසුකම්.—

(අ) වයස 1970.3.15 වැනි දිනට වයස අවුරුදු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) (i) අයදුම්කරුවන්ට පිළිගත් ආයතනයකින් ලබාගත් කිරි පට්ටි පිළිබඳ හෝ සත්ව පාලනය පිළිබඳ හෝ ඩිප්ලෝමා සහතිකය නැතහොත් පේරාදෙණියේ කෘෂිකර්ම පාඨ මාලාවේ සහතිකය හෝ තිබිය යුතුය.

(ii) අයදුම්කරුවන්ට සත්ව පාලන වැඩ ගැන පළපුරුද්ද තිබිය යුතුයි. ගවයන් බලා ගැනීම හා පාලනය පිළිබඳ පළපුරුද්ද අත්‍යවශ්‍යය. ඔවුන් හොඳ ශාරීරික පෙනුමෙන් සිටිය යුතුයි.

(ඇ) ඉහත සඳහන් " ආ (i) හා (ii) " යන කරුණු තහවුරු කිරීම සඳහා සහතිකපත් අයදුම්පත් සමඟ එවිය යුතුයි.

4. පළාත් පාලන සේවයේ ජ්‍යෙෂ්ඨ පශු ඕවර්සියර්වරුන්ගේ අයදුම්පත් ද, වයස හා වෘත්තීය සුදුසුකම් ගැන නොතකා භාරගනු ලැබේ. එහෙත්, එසේ භාරගනු ලබන්නේ, 1970.3.15 දිනට අවුරුදු 10 කට නොඅඩු වන පශු කාර්ය පිළිබඳ පළපුරුද්දක් ඇතහොත් සහ ඔවුන්ගේ වැඩ සහ හැසිරීම සතුටුදායක නම් පමණී.

5. මේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත් කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, 1970.3.15 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි. සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වැනි 16 වැනි කොටුවල පහත සඳහන් කරුණු යොදා ගත යුතුයි.

" 13. (ඒ) කිරි පට්ටි සහ/හෝ සත්ව පාලනය පිළිබඳ සුදුසුකම් (සහතිකවල පිටපත් අමුණන්න) :————.

(බී) ඉහත සඳහන් සුදුසුකම් ලබාගත් ආයතනය සහ ඒවා ලබාගත් දිනය :————.

16. පළපුරුද්ද.—

(ඒ) සත්ව පාලන කටයුතු :————.
(බී) ගවයින් බලාගැනීම හා පාලනය :————.
(සී) සාමාන්‍ය පශු කාර්යයන් :————. "

7. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සාවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී ප්‍රමාදයට හේතු වූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණී.

8. සුදුසු අයදුම්පත් පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 9 වෙනි දින,
කොළඹ, තැ. පෙ. 530,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

2–1080—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන සේවය

### ගිනිනිවන හමුදාවේ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි තනතුර

යථෝක්ත තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. වැටුප.—තනතුරට අදාළ වැටුප් ක්‍රමය, වර්ෂයකට රුපියල් 6,720—360 × 12—480 × 5—රුපියල් 13,440 යනුවෙනි. එහි රුපියල් 9,240 ක් වූ වාර්ෂික වැටුපට පෙර කාර්යක්ෂමතා කඩඉමක් වේ. රජයේ සේවකයින්ට අදාළ වන ප්‍රමාණ සහ කොන්දේසි අනුව විවාහක දීමනාවක් ද විවාහක නිලධාරීන්ට ගෙවනු ලැබේ.

තෝරාගනු ලබන අයදුම්කරු, රුපියල් 8,880 යන වාර්ෂික වැටුපෙන් ඔබ්බට යාම සඳහා, ලන්ඩන්හි ගිනි නිවාරණ ඉංජිනේරුවන්ගේ ආයතනයේ උපාධි පරීක්ෂණයෙන් සමත්විය යුතුය.

3. අවශ්‍ය සුදුසුකම්.—(අ) වයස : 1970. 3. 31 දිනට වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතුය.

(ආ) අයදුම්කරුවන් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරීන් විය යුතුයි. (බී.එස්.සී. උපාධිධාරීන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) අයදුම්කරුවන් මනා පෞරුෂත්වයකින් යුක්ත වූද, යටත් පිරිසෙයින් උස අඩි 5 අඟල් 4 කින් හා බර රාත්තල් 125 කින් යුක්ත වූද අය විය යුතුය.

(ඇ) ප්‍රසිද්ධ විභාගයකදී ගිනි නිවාරණය ඉංජිනේරු ශිල්පය පිළිබඳව සුදුසුකම් ලබා ඇති අය විසින් එවනු ලබන අයදුම්පත් ද සලකා බලනු ලැබේ. එතෙකුදු වුවත් එම අයදුම්කරුවන් යටත් පිරිසෙයින් විද්‍යා විෂයයන් තුනක් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් සමත් වී තිබිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට 1970. 3. 31 දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන ලෙස එවිය යුතුයි.

6. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පෙර ලැබුණු බවට සහතික කර, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

7. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර පමණක් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

ඒ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 15 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ දීය.

2–1081—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## රාත්‍රී මුරකරු තනතුර—නැගෙනහිර කැඳැකෝරළේ ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා එවන අයදුම්පත්‍ර "නැගෙනහිර කැඳැකෝරළේ ගම්සභාවේ සභාපති, ගම්සභා කාර්යාලය, කැඳැව—අනුරාධපුරය" යන ලිපිනයට 1970 මාර්තු මස 14 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

1. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 540—30 × 8—24 × 1—රු. 804කි. (මෙම වැටුප් ක්‍රමය රජයේ ඒකාබද්ධ වැටුප් ක්‍රමයට පරිවර්තනය කිරීමට යටත්ය) රු. 636 සහ 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් වේ.

2. අවශ්‍ය සුදුසුකම්.—

(අ) 1970 මාර්තු මස 14 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුය. එහෙත් දැනට පළාත් පාලන ආයතනවල හා රජයේ සේවයේ නියුක්ත වූවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

(ආ) අපේක්ෂකයෝ සිංහල 5 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතුය. උපරිම අධ්‍යාපන සුදුසුකම් වශයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගය දක්වා පමණි.

(ඇ) යහපත් චරිතයක් ඇති අයෙකු විය යුතුයි. පළාතේ ග්‍රාම සේවක මහතාගෙන් හා වෙනත් වැදගත් අයෙකුගෙන් මෑතදී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් හා උප්පැන්න සහ අධ්‍යාපන සහතිකවල පිටපත් ද ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය.

නැගෙනහිර කැඳැකෝරළේ ගම් ප්‍රදේශ සීමාව තුළ පදිංචි කරුවන් ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ. පත්කිරීම සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ හෝ අප්‍රසිද්ධියේ ගම්සභා නියෝජිත මහතෙකුගේ හෝ ගම්සභාවේ නිලධාරි මහතෙකුගේ උදව් ගැනීමට තැත්කිරීම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට හේතුවනු ඇත.

3. මෙම තනතුර අර්ථසාධක අරමුදලට යටත්වන අතර, තෝරා පත්කර ගන්නා අයදුම්කරු ගම්සභාව විසින් පසුව තීරණය කරනු ලබන ආකාරයක ඇපයක් තැබිය යුතුය.

4. ඉල්ලුම්පත්‍ර, පළාත් පාලන සේවයේ පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ අවසානයට දන්වා ඇති පොදු ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට ගත යුතුය.

සී. ඇම්. අප්පුහාමි,
නැගෙනහිර කැඳැකෝරළේ ගම්සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 12 වැනි දින,
නැගෙනහිර කැඳැකෝරළේ ගම්සභා කාර්යාලයේදී ය.

2–1088—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### කායාලීය කාර්ය සහායක තනතුර—මැටිගහතැන්න ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—වර්ෂයකට රු. 540—30 × 8—24 × 1 රු. 804. රු. 636 සහ රු. 732 යන වාර්ෂික වැටුපට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. අවශ්‍ය සුසුදුකම්.—

(අ) වයස : 1970 අප්‍රේල් මස 1 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු හා 30 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල 6 වැනි ප්‍රමාණය සමත් වී සිටිය යුතුයි.

4. පළාත් පාලන සේවා සාමාජිකයින්ගේ හා ප්‍රාදේශීය බල මණ්ඩල වල ස්ථිර සේවයේ සිටින සේවකයින්ගේ අයදුම්පත්, ඔවුන් අනෙක් සුදුසුකම් ලබා ඇත්නම් වයස පිළිබඳ නියමය නොසලකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම්පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදුන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1970 මාර්තු මස 20 වැනි දින හෝ ඊට ප්‍රථම මැටිගහතැන්න ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්ට එවිය යුතුයි.

ධනපාල සිරිවර්ධන,
මැටිගහතැන්න ගම්සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 20 වැනි දින,
ගල්පුල්ල-මඩුල්සීම,
මැටිගහතැන්න් ගම්සභා කාර්යාලයේදී ය.

2–1144—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් පාලන සේවය

### පළාත් පාලන විදුලි පෝර්මන්වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1970 අප්‍රේල් 20

පළාත් පාලන විදුලි පෝර්මන්වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ තරඟ විභාගයක් විභාග කොමසාරිස් විසින් 1970 අප්‍රේල් 20 වැනි දින කොළඹ හා යාපනයේදී පවත්වනු ලැබේ.

2. (i) **වැටුප් ක්‍රමය.**—සමත්වන අයදුම්කරුවන් රු. 2,760න් පටන් ගෙන, රුපියල් 60 බැගින් වැඩිවීම් 18කින් යුක්ත වූ රු. 3,840 දක්වා වැඩිවන වාර්ෂික වැටුප් ක්‍රමයක් හිමි, පළාත් පාලන විදුලි පෝර්මන් වරුන්ගේ සේවයේ දෙවැනි ශ්‍රේණියට පුරප්පාඩු ඇතිවන අන්දමට පත්කරනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 3,360 නැගුමට පෙර කාර්යක්ෂමතා කඩඉමක් තිබේ. රජයේ ප්‍රමාණයන්ට හා කොන්දේසි අනුව විවාහක නිලධාරින්ට විවාහ දීමනාවක් ද ගෙවනු ලැබේ.

(ii) **සේවා පිළිබඳ කොන්දේසි**—

(ඒ) තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තවද, තෝරාගනු ලබන අපේක්ෂකයෝ පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රයෝජන ලැබීමට සුදුස්සෝ වෙත්:

(බී) **නිවාඩු දීම හා අනිකුත් සේවා කොන්දේසි :** පළාත් පාලන සේවා ආඥපනතේ විධිවිධාන හා ඒ යටතේ සම්පාදිත වෙනත් රෙගුලාසිවලට සහ ප්‍රාදේශීය බලමණ්ඩල අතුරු ව්‍යවස්ථා හා රෙගුලාසිවලට අනුව නිග මනය කරනු ලැබේ;

(සී) සමත්වන අයදුම්කරුවෝ අවුරුදු තුනක ආධුනික කාල පරිච් ඡේදයක් යටතේ පත්කරනු ලබන අතර, ඔවුහු ලංකාවේ ඕනෑම ප්‍රදේශයකට පත්කිරීමට පුළුවන. ඔවුහු පළාත් පාලන සේවා ආඥපනතේ විධිවිධාන වලටත්, එම ආඥපනත පිළිබඳව කරනු ලබන වැඩිදුර සංශෝධනයන්ට හා ඒ අනුව පනවන රෙගුලාසිවලටත්, කලින් කලට සම්මත කරන අනිකුත් සේවා කොන්දේසි වලටත් යටත් වෙයි;

(ඩී) පළාත් පාලන සේවයේ ස්ථිර වූත්, විශ්‍රාම වැටුප් සහිත වූත් තනතුරු දරණ තෝරාගනු ලබන අපේක්ෂකයින් පළාත් පාලන සේවා රෙගුලාසිවල අංක 22(2) දරන රෙගුලාසිය අනුව වැඩ බැලීමේ පදනමක් මත පත්කරනු ලැබේ. ඔවුන් සිය තනතුරුවල ස්ථිර කිරීම වැඩ බැලීමේ කාල සීමාව අවසානයේදී සලකා බලනු ලැබේ. වැඩ බැලීමේ කාල සීමාව, ප්‍රථම අවස්ථාවේදී හය මාසයකට සීමාවේ;

(ඊ) දෙවැනි ශ්‍රේණියේ පෝර්මන්වරුන්ගේ මූලික වැටුපට වැඩි වැටුපක් ලබන ප්‍රාදේශීය බලමණ්ඩලයක අඛණ්ඩ සේවයක් ඇති, සමත්වන අයදුම් කරුවන් මෙම වැටුප් ක්‍රමයේ සුදුසු පෙත්තක පිහිටුවනු ලැබේ;

(එෆ්) සමත්වන අයදුම්කරුවන් පත්වීම ලැබීමෙන් පසුව තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩලයේ සීමාව තුළ පදිංචි විය යුතුයි.

3. (i) සමත්වන අයදුම්කරුවන් ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටම සම්පාදනය කොට ඇති හෝ මින්මතු සම්පාදනය කළ හැකි ව්‍යවස්ථාවන්ට එකඟව ක්‍රියාකළ යුතුය;

(ii) ආධුනික සේවා කාලය තුළදී සිංහල භාෂා විෂයයෙහි ප්‍රවීණත්වයක් ලබා ගත යුතු අතර, ඔවුන්ගේ පත්වීම ස්ථිර කිරීම අනික් කරුණු අතර, සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී;

(iii) ආධුනික සේවා කාලය තුළදී සේවය අසතුටුදායක වුවහොත්, එසේ නැතහොත් සිංහල භාෂාව පිළිබඳ පරීක්ෂණයෙන් අසමත් වුවහොත් ආධුනික සේවා කාලය ඇතුළත ඕනෑම අවස්ථාවකදී, නැතහොත් අවසාන යේදී සේවය නැවැත්විය හැකිය. එසේ වුවද, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත් වයක් ලබා ගැනීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත්විය හැකිනම් සහ එසේම වැඩ සහ හැසිරීම සතුටුදායක වී නම් සේවය නැවැත්වීම කල්දැමිය හැකිය. එසේම නියමිත දිනයේ සිට සෑහෙන කාල පරිච්ඡේදයක් ඇතුළතදී පරීක්ෂණයෙන් සමත් වුවහොත් කොමිෂන් සභාවේ අභිමතය පරිදි ජ්‍යෙෂ්ඨතා හානිය අත්හැර දැමිය හැකිය.

4. **සුදුසුකම්**—

(i) අයදුම්කරුවෝ යහපත් චරිතයෙන් යුක්ත විය යුත්තාහ;

(ii) අයදුම්කරුවෝ * ලාංකික විය යුත්තාහ;

(iii) (ඒ) අයදුම්කරුවෝ මීට ප්‍රථම සත්වැනි පන්තියේ හෝ එයට වඩා උසස් විභාගයකින් (සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන්) සමත්වී සිටිය යුත්තාහ;

(බී) ඔවුන් යටත් පිරිසෙයින් විදුලි ඉංජිනේරු සමාගමක් යටතේ හෝ චාර්ටඩ් ඉංජිනේරුවෙක් යටතේ හෝ රජයේ ආයතනයක හෝ ප්‍රාදේශීය සැපයීමේ බල මණ්ඩලයක් යටතේ හෝ (කම්බිකරුවෙකු හෝ විදුලි යතුරු පුවරුවක ක්‍රියා කරන්නෙකු හෝ වෙන යම් සමාන තත්ත්වයක සිටින්නෙකු වශයෙන් හෝ) අවුරුදු 5ක ප්‍රායෝගික පළපුරුද්දක් තිබිය යුතුය;

(සී) ලංකා කාර්මික විද්‍යාලය මගින් "විදුලිය" පිළිබඳව පවත්වනු ලබන සන්ධ්‍යා වෘත්තීය පාඨමාලාව සම්පූර්ණ කළ අයදුම්කරුවන් නම් —විදුලි ඉංජිනේරු සමාගමක් යටතේ චාර්ටඩ් විදුලි ඉංජිනේරුවරයෙක් යටතේ හෝ රජයේ ආයතනයක් යටතේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක් යටතේ හෝ අවුරුදු 2ක ප්‍රායෝගික පළපුරුද්දක් සමග;

(ඩී) අතිශක්මතාව සහ අවශක්මතාව බෙදා හැරීමේ ක්‍රමය, විදුලි පරි වර්තනය, ඩීසල් යන්ත්‍රාගාර සහ ස්විච් ගියර් ක්‍රියා කිරීම හා නඩත්තු කිරීම පිළිබඳව දැනීමක් හා පාරිභෝගිකයන්ගේ විදුලි රෝපණයක් සහ නිවාස සේවා මාපක පරීක්ෂා කිරීම පිළිබඳ දැනීමක් තිබිය යුතුය. ආරක්ෂක නීති සහ විදුලි උපකරණ සහ ගොඩනැගිලි සඳහා අයි. ඊ. ඊ. රෙගුලාසි ගැන වැඩ කිරීමේ දැනීමක් ද තිබිය යුතුයි. විදුලි ඒකක, ඕම් සහ කර්චොෆ්ගේ නීති හා ඒවා භාවිතය පිළිබඳ දැනුම මිණුම් උපකරණ හා ගාස්තු පිළිබඳ දැනීමක් ද තිබිය යුතුය.

(iv) 1970 මාර්තු 17 වැනි දිනට අයදුම්කරුවෝ වයස අවුරුදු 20ට නො අඩු හෝ 40ට නොවැඩි අය විය යුත්තාහ. යුද්ධ සේවයේ සිටි අයදුම් කරුවන්ට තමන් පසුගිය යුද්ධයේදී ක්‍රියාකාරි සේවයේ යෙදී සිටි කාලය තම වයසින් අඩුකර ගත හැක.

**සැ. යු.**—(i) අවශ්‍ය කාර්මික දැනුම හා පළපුරුද්ද තිබෙන ප්‍රාදේශීය බලමණ්ඩලයක් තුළ නගරයකට විදුලි ආලෝකය සැපයීමේ ක්‍රමයක් යටතේ ස්ථිර තනතුරු දරන විදුලි පුවරු ක්‍රියාකරුවන්ට හෝ කම්බි කරුවන්ට හෝ සාමාන්‍ය අධ්‍යාපනික සුදුසුකම් නොමැති වුවද මෙම විභාගයට ඉල්ලුම් කළ හැකිය.

(ii) කොළඹ නාගරික සභාවේ මහජන ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටි, තනතුරු අහෝසි කිරීමේ හේතුවෙන් විශ්‍රාම යවනු ලැබූ ට්‍රොලි බස් රියැදුරන්ගේ හා කොන්දොස්තරවරුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. නමුත් එසේ භාරගනු ලබන්නේ ඔවුන්ට 4(i) (ii), සහ (iii) වැනි ඡේදයන්හි සඳහන් සුදුසුකම් ඇතොත් සහ 1970.3.17 වැනි දිනට ඔවුන්ගේ වයස අවුරුදු 50ට නොවැඩි නම් පමණි.

5. **සුදුසුකම්**—

(i) විභාගයට ඇතුළත්වීමේ අයදුම් පත්‍ර මෙහි සඳහන් ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට, "ලේකම්, පළාත් පාලන සේවා කොමිෂන් සභාව, තැ.පෙ. 530, කොළඹ" යන ලිපිනයට එවිය යුතුයි.

(ii) අයදුම්පත් 1970.3.17 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එමදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලියුම් කවරයේ වම්පස මුදුනේ විභාගයේ නම පැහැදිලිව ලියා තිබිය යුතුයි.

(iii) අයදුම්පත්වල රුපියල් 5ක් වටිනාකම ඇති මුද්දර අලවා යථා පරිදි අවලංගු කොට තිබිය යුතුයි.

(iv) දැනට රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවයේ නියුක්ත අයදුම්කරුවන් සිය අයදුම්පත්‍ර එවිය යුත්තේ තමන් දැනට සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් හෝ ප්‍රාදේශීය බලමණ්ඩල ප්‍රධානීන් මාර්ග යෙනි. මෙසේ කිරීමට යම් අයදුම්කරුවෙකු අපොහොසත් වුවහොත් ඔහු විභාගයට නුසුදුස්සෙකු ලෙස සලකනු ලැබේ. 1970.3.17 වැනි දින හෝ ඊට ප්‍රථම පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ සිය අයදුම් පත්‍ර ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තමා සේවය කරන දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල ප්‍රධානීන් වෙත සිය අයදුම්පත් කල්වේලා ඇතිව ඉදිරිපත් කරන ලෙස අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

6. (i) කිසිම ලියවිලි ආදියක් අයදුම්පතට අමුණා නොතිබිය යුතුය එහෙත් වුවමනා කරුණු සියල්ලම අයදුම් පතෙහි සඳහන් කළ යුතුයි;

(ii) විභාගයේදී සමර්ථතාවයක් දක්වූවන් විසින් විභාගයට පෙනී සිටීමට ඔවුන්ගේ සුදුසුකම් ලියවිලිවලින් ඔප්පු කළ යුතුයි. ඔවුන් විසින් එම ලියකියවිලි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි. නැතහොත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටි කල්හි අප්‍රමාදව ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

(iii) පහත සඳහන් ලියවිලි අවශ්‍ය වනවා ඇත:—

(ඒ) පළාත් පාලන සේවා කොමිෂන් සභාවට ඒත්තු ගතහැකි වන යහපත් චරිතය පිළිබඳ වග කිවයුතු පුද්ගලයෙකු විසින් අත්සන් කරන ලද සහතිකයක්. අයදුම්කරු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක අධ්‍යාපනය ලැබූවෙක් නම්, ඔහු අන්තිම වරට ඉගෙනුම ලැබූ රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවේ ප්‍රධානා චාර්යවරයාගෙන් ලැබූ චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති නම් කැමැති පරිදි, අයදුම්කරුගේ ගුරුවරයාගෙන් හෝ පාඨශාලාචාර්යවරයාගෙන් හෝ රජයේ නිළධාරියෙකුගෙන් (වර්ෂයකට රු. 2,400 හෝ ඊට වැඩි වැටුපක් ලබන) හෝ සමාදාන විනිශ්චය කාරයෙකුගෙන් හෝ අධිනීතිඥවරයෙකුගෙන් හෝ නීතිඥවරයෙකුගෙන් හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු ගෙන් හෝ සාමාන්‍ය වශයෙන් ඒ පිළිබඳව කරුණු සොයා බැලිය හැකි ප්‍රසිද්ධ පුද්ගලයෙකුගෙන් හෝ ලබාගත් චරිත සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි;

(බී) අපේක්ෂකයාගේ උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනෙහි සහතික කළ පිටපතක් (පාඨශාලා භාවිතය සඳහා හෝ අධ්‍යාපනික කටයුතු උදෙසා හෝ නිකුත් කරන ලද විශේෂ උප්පැන්න සහතික පත්‍ර හෝ උප්පැන්න ලියා පදිංචි කිරීමේ සටහනකින් උපුටා ගත් සහතික කළ උද්ධෘත හෝ භාරගනු නොලැබේ);

(සී) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ මුල් සහතික පත්‍ර;

(ඩී) හඳුනා ගැනීමේ පත්‍රය.

(iv) විභාගයට ඉල්ලුම් කරන අවස්ථාවේදී වුවමණා සියලුම ලියකියවිලි සූදානම්ව තබා ගන්නා ලෙස අපේක්ෂකයින්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ඉල්ලා සිටි විටෙක ඒවා ඉදිරිපත් කිරීමට ප්‍රමාද වන අපේක්ෂකයන්ගේ ඇතුළත්වීම අවලංගු කරනවා ඇත.

සැ.යු.—(ඒ) නියමිත ආකෘති පත්‍රයේ නොලියන ලද අයදුම් පත්‍ර භාරගනු නොලැබේ.

(බී) මෙම විභාගයේ නීතිරීතිවලට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

7. **විභාගයට ඇතුළත් කර ගැනීම.**—පිළිගනු ලැබූ අයදුම් පත්‍ර හිමි අයදුම්කරුවන්ට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් ප්‍රවේශ පත්‍ර නිකුත් කරයි. විභාගයට පෙනී සිටින අයදුම්කරුවෝ ස්වකීය ප්‍රවේශ පත්‍ර, විභාගය පරිපාලනය සඳහා පත් කරනු ලැබ සිටින නිළධාරියාට ඉදිරිපත් කළ යුතුයි. එසේ ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් නොකරන අපේක්ෂකයින්, නුසුදුස්සන් බවට පත්කරනු ලැබේ.

අයදුම්කරුවන් තමනට නියමිත විභාග ශාලාවෙහි විභාගයට පෙනී සිටිය යුතුය. තමාට නියමකොට ඇති විභාග ශාලාව හැරෙන්නට වෙනත් එකක විභාගයට පෙනී සිටීම සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන්ට විභාගයට පෙනී සිටීමට අවසර නොදෙනු ඇත.

ප්‍රවේශ පත්‍රයත් සමඟ කාල සටහනේ පිටපතක්ද අයදුම්කරුවන්ට එවනු ලැබේ. විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාගය පැවැත්වෙන දිනයේදී ස්වකීය ප්‍රවේශ පත්‍රය විභාග ශාලාව භාර නිළධාරියාට භාරදිය යුතුයි.

විභාගය පැවැත්වෙන දිනයට යටත් පිරිසෙයින් දින 7කටවත් පළමු ස්වකීය ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත්, ඒ බව වහාම "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ. පෙ. 530, කොළඹ" යන ලිපිනයට දැනුම්දිය යුතුයි. ඇතුළත්වීමේ ප්‍රවේශ පත්‍ර නොලැබුණ බව දැනුම්දෙන අතරම, පහත සඳහන් තොරතුරුද සැපයිය යුතුයි:—

(i) විභාගයේ නම,

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම,

(iii) සම්පූර්ණ ලිපිනය.

සැ. යු.—විභාගයට ඇතුළත්කර ගැනීම ඊට සුදුසුකම් පිළිගැනීමක් හැටියට සළකනු නොලැබේ.

8. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ විභාගයට පසුව හෝ විභාගය පැවැත්වෙද්දී හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ ඇතුළත්වීම අවලංගු කරන්නට පුළුවන.

9. අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද යම්කිසි තොරතුරක් ඔවුන් දැනුවත්වම අසත්‍ය බව පෙනී ගියහොත්, ඔවුන්ට පත්වීම් දෙනු ලැබුවත් සේවයෙන් පහ කරන්නට පිළිවන. සිතාමතාම යම්කිසි සත්‍යයක් යටපත් කර තිබුණහොත්, ඒ සමානම දඬුවම් ලැබීමට පිළිවන.

10. **මුදල් ආපසු දීම.**—කවර කැරණක් නිසාවත් මුද්දර ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

11. **විභාගයට පෙනී සිටීම සඳහා නිවාඩු.**—ස්වකීය දෙපාර්තමේන්තුවල හෝ ප්‍රාදේශීය බලමණ්ඩලවල සේවය කරන පිළිගන්නා ලද අයදුම් පත්‍ර හිමි නිළධාරීන්ට විභාගයට පෙනී සිටීම සඳහා රාජකාරි නිවාඩු දෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් හා ප්‍රාදේශීය බලමංඩලවල සභාපතිවරුන්ගෙන්, විශේෂ කොමසාරිස්වරුන්ගෙන් හා නාගරික කොමසාරිස්වරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

12. **හඳුනා ගැනීමේ පත්.**—තමා පෙනී සිටින එක් එක් විෂයයක් පාසා විභාගශාලා භාර නිළධාරියාට අයදුම්කරු තමා බව ඒත්තු ගැන්විය යුතුය. මේ සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් පිළිගනු ලැබේ:—

(ඒ) තැපැල්පතිතුමා විසින් නිකුත් කරනු ලබන හඳුනා ගැනීමේ පතක්;

(බී) මේ විභාගයේ දිනයට කලින් අවුරුදු 3 ක කාල සීමාව ඇතුළතදී නිකුත් කරන ලද වලංගු පාස්පෝට් පත්‍රයක්;

(සී) මේ විභාගය පවත්වන දිනට කලින් අවුරුදු 3 කාල සීමාවක් ඇතුළත රජයේ දෙපාර්තමේන්තුවක් මගින් නිකුත් කරන ලද අයිතිකරුගේ ඡායාරූපයක් සහිත සහතිකයක් හෝ බලපත්‍රයක් හෝ වෙනත් ලියවිල්ලක්;

(ඩී) අත්සන් පත්‍රය සහතික කිරීමට සුදුසුකම් ලබා ඇති අයෙකු විසින් පාස්පෝට් ප්‍රමාණයේ ඡායා රූපයක පසුපිටෙහි දෙන ලද පහත සඳහන් සහතිකයක් දරණ ඡායා රූපයෙක්:—

පසු පිටෙහි සඳහන් ඡායා රූපය මෙහි අත්සන් කර ඇති ................. ................................................ යන අයගේ බව මම සහතික කරමි.

(අයදුම්කරුගේ නම)

................................................

අයදුම්කරුගේ අත්සන

................................................

අයදුම්කරුගේ අත්සන සහතික කරන අයගේ අත්සන

නම හා තරාතිරම :................................................

ලිපිනය : ................................................

විභාග ශාලාවේදී තමාගේ හැඳින්වීමේ පත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත් කරනු ලැබේ.

13. **විභාග පරිපාටිය.**—පහත සඳහන් වන්නේ විභාගය සඳහා ඇති විෂයයන් සහ ඒ එක් එක් විෂයයන් වෙනුවෙන් නියමිත ලකුණුත්ය. අශෝභන අත් අකුරු හා අක්ෂර වින්‍යාසයේ වැරදි ගැනද සියලුම ලිඛිත උත්තර පත්තරවලින් ලකුණු අඩු කරනු ලැබේ. නොපැහැදිලි ලෙස අකුරු ලියන ලද විභාග අපේක්ෂකයින් නුසුදුස්සන් බවට පත්වීමට ඉඩ තිබේ.

| | ලකුණු |
|---|---|
| ඉහත සඳහන් 4 (iii) වැනි ඡේදයේ (බී), (සී), (ඩී) යන අනු ඡේදයන්හි දක්වෙන විෂයයන් සම්බන්ධයෙන් අයදුම්කරුගේ ප්‍රායෝගික හා සිද්ධාන්තික මූලික දැනුම පරීක්ෂා කිරීම සඳහා පැය දෙකහමාරක ප්‍රශ්ණ පත්‍රයක්; මෙම ප්‍රශ්ණ පත්‍රය කොටස් දෙකකට බෙදනු ලැබේ. එනම්— i "ප්‍රායෝගික" හා (ii "සිද්ධාන්ත" යනුවෙනි ... | 100 |

විභාගය පවත්වනු ලබන්නේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන මාධ්‍යයන් ගෙනි.

14. ලිඛිත විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් කොළඹ දී පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයට කැඳවිය යුතු අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

15. සමත්වන අයදුම්කරුවන්ගේ නම් ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පළ කරනු ලැබේ. පුරප්පාඩු ඇතිවන අන්දමට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

16. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් විසින් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරික වශයෙන් යෝග්‍ය බව සනාථ කිරීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

ජේ. බී. සමරජීව,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 පෙබරවාරි මස 19 වැනි දින,
තැ.පෙ. 530,
කොළඹ.

සැ.යු.—විභාගය පිළිබඳ කිසිම ලිපියක් ලේකම්වරයාගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

*පළාත් පාලන සේවයට බඳවා ගැනීම පිළිබඳ සෑම කරුණක් සඳහාම "ලාංකික" යන පදයෙන් අදහස් කරන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් හෝ ලංකාවේ පුරවැසි බව ලබා ඇති තැනැත්තන්ය.

## විභාගයට ඇතුළත් කර ගැනීමේ ඉල්ලුම් පත්‍රය

විභාග අංකය :————.

**පළාත් පාලන විදුලිය ෆෝර්මන්වරුන්ගේ සේවයේ II වැනි ශ්‍රේණියට බඳවා ගැනීමේ විභාගය—1970.4.20**

(ගැසට් නිවේදනයේ IVවැනි ඡේදයේ සඳහන් සුදුසුකම් නැති අයදුම්කරුවන් ඉල්ලුම් කිරීම අවශ්‍ය නැත.)

1. ඔබේ පුරුදු අත්සන :————.

වාසගමේ මුල් අකුරු සහිත ඔබේ නම :————.

(ඒ) වාසගම සහිත ඔබේ නම් සියල්ල සම්පූර්ණයෙන් :————.
(පැහැදිලි අකුරෙන් ලියන්න)

(බී) සම්පූර්ණ ලිපිනය :————.
(වෙනස්වූ වහාම ඒ බැව් දන්විය යුතුයි)

(සී) විභාග මධ්‍යස්ථානය : (කොළඹ, යාපනය) :————.

2. (ඒ) ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ—

(i) පරම්පරාවෙන්ද? :————.

නැතහොත්,

(ii) ලියාපදිංචි වීමෙන්ද ? :————.

(බී) උපන් ස්ථානය—

(i) අපේක්ෂකයාගේ :————.

(ii) අපේක්ෂකයාගේ පියාගේ :————.

(iii) අපේක්ෂකයාගේ පිය පක්ෂයේ මුත්තාගේ :————.

3. (ඒ) ඔබ උපන් දිනය—

වර්ෂය :————. මාසය :————. දිනය :————.

(බී) 1970 මාර්තු 17 වැනිදට ඔබේ වයස—

අවුරුදු :————. මාස :————.

4. විභාගයට පෙනී සිටීමට අදහස් කරන්නේ නිවේදනයේ 4 (IV) ඡේදය යටතේ දක්වෙන පරිදි සේවා මුක්ත අයට දෙනු ලබන අනුග්‍රහ යටතේ නම්, පහත දක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :

(ඒ) සේනාංකය/දෙපාර්තමේන්තුව සහ නිලය/පදවිය :————.

(බී) 1939 සැප්තැම්බර් 3 ද සිට 1949 දෙසැම්බර් 31 ද දක්වා කාලය තුළ සම්පූර්ණ ක්‍රියාත්මක සේවා කාලය :————.

(සී) අඛණ්ඩ තාවකාලික සේවා කාලය :————.

5. (ඒ) විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 4 වැනි ඡේදයේ පළමුවන සටහන යටතේ දී ඇති විශේෂ අනුග්‍රහ යටතේ නම්, පහත දක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :

ඔබ පළාත් පාලන සේවයේ ස්ථිර තනතුරක් දරන්නේ නම්—

(i) දරණ තනතුර :————.

(ii) ඊට පත්වූ දින :————.

(බී) විභාගයට පෙනී සිටීමට අදහස් කරනුයේ නිවේදනයේ 4 වැනි ඡේදයේ දෙවැනි සටහන යටතේ දී ඇති විශේෂ අනුග්‍රහ යටතේ නම්, පහත දක්වෙන කරුණු පිළිබඳ තොරතුරු දක්වන්න :

(i) දරූ තනතුර :————.

(ii) ඊට පත්වූ දිනය :————.

(iii) සේවය නතර කිරීමට හේතුව :————.

6. විභාගයට පෙනී සිටින්නේ පහත සඳහන් කුමන මාධ්‍යයෙන්ද යන වග සඳහන් කරන්න :

(ඒ) සිංහල :————.

(බී) දෙමළ :————.

(සී) ඉංග්‍රීසි :————.

7. (ඒ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයන් හා අස්වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(බී) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම්, එම සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

8. ඔබ මේ විභාගයට ඇතුළත් වීමට සුදුස්සකු වීම සඳහා සමර්ථ වී ඇති විභාගය පිළිබඳ විස්තර සහ පළපුරුද්ද (ගැසට් නිවේදනයේ 4 (iii) ඡේදය බලන්න) :—

| | ප්‍රධාන | අතිරේක |
|---|---|---|
| (ඒ) විභාගයේ නම සහ දිනය | ............ | ............ |
| (බී) මධ්‍යස්ථානය | ............ | ............ |
| (සී) විභාග අංකය | ............ | ............ |

9. කිසියම් වරදකට ඔබ කවද හෝ වරදකරු කරනු ලැබ තිබේ නම්, හෝ චෝදනා කරනු ලැබ තිබේ නම්, හෝ සිතාසි නිකුත් කරනු ලැබ තිබේ නම් හෝ ඒ වග සඳහන් කරන්න. එසේ නම්, ඒ දිනයද, වරද ස්වභාවයද, උසාවියේ නමද, නඩු නොම්මරයද මෙහි දක්වන්න :————

මෙහි සඳහන් කරන ලද ප්‍රකාශයන් මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බව මගේ ආත්ම ගෞරවයේ නාමයෙන් සහතික කරමි. තවද, මම මෙම විභාගය පිළිබඳ රෙගුලාසිවලට එකඟව ක්‍රියා කිරීමටද බැඳෙමි. එසේම මේ විභාගය පිළිබඳ රෙගුලාසිවලට අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කරන සේ සැළකීමට ඉඩ ඇති බවද මැනවින් දනිමි.

| |
|---|
| අයදුම්කරු අවශ්‍ය මුද්දර (රු. 5) මෙහි අලවා ඒවා මත අත්සන් කළ යුතුයි. |

————,
අපේක්ෂකයාගේ අත්සන.

දිනය :————.

**සංලක්ෂ්‍යය.**—අපේක්ෂකයින් විසින් මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ යුත්තේ තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ/ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානයා හෝ සමාදාන විනිශ්චයකාරවරයකු හෝ ආදායම් පාලක නිලධාරියෙකු හෝ පෙරකදෝරු කෙනෙකු හෝ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හෝ රුපියල් 2,400 ක් හෝ ඉන් ඉහළ වාර්ෂික වැටුපක් ලබන ආණ්ඩුවේ ස්ථිර සේවයේ නියුක්ත නිළධාරියෙකු හෝ යුද්ධ හමුදාවේ, නාවික හමුදාවේ හෝ ගුවන් හමුදාවේ අධිකාර ලත් නිළධාරියෙකු හෝ ඉදිරිපිටය.

අපේක්ෂකයා මෙම ඉල්ලුම් පත්‍රය යම්කිසි තැනැත්තකු ඉදිරිපිටදී අත්සන් කරයිද, ඒ තැනැත්තාගේ සහතිකය :—

————පදිංචිකරුවකු වන ————නමැති අය මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1970————මස————වැනි දින ඔහු මා ඉදිරිපිටදී මෙම ඉල්ලුම් පත්‍රය අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන

නම :————.

පදවිය හා තරාතිරම :————.

**ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ සහතිකය**

මෙම අපේක්ෂකයා මෙම ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තුවේ. 19————මස————වැනි දින සිට ———— වශයෙන් ස්ථිර/තාවකාලික සේවයේ යෙදී සිටින බවද, ඔහුගේ සේවය සෑම විටම සතුටුදායකව පැවති බවද සහතික කරමි.

————,
ප්‍රාදේශීය බලමණ්ඩලයේ/දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.

නම :————.

ප්‍රා.බ.ම./දෙපාර්තමේන්තුව :————.

පදවිය :————.

දිනය :————.

**සැ.යු.**—(i) මෙම ආකෘතිපත්‍රය අපේක්ෂකයාගේ අත් අකුරින් නිවැරදිව ද, පැහැදිලිවද පුරවා 1970 මාර්තු මස 17 වැනි දිනට හෝ ඉන් පෙර හෝ "පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්, තැ.පෙ. 530, කොළඹ" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. අවශ්‍ය තොරතුරු සියල්ල සඳහන්කොට නැත්නම්, ඉල්ලුම් පත්‍රය එහි අන්තර්ගත කරුණු උඩ පමණක් විනිශ්චයට භාජනකොට ප්‍රතික්ෂේප කරනු ලැබීමට ඉඩ තිබේ. ඉල්ලුම් පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පැත්තේ උඩ කෙළවරෙහි විභාගයේ නම සඳහන් කළ යුතුයි.

(ii) ඉල්ලුම් පත්‍රය එවන කාලයේදී ආණ්ඩුවේ සේවයේ හෝ පළාත් පාලන සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයින් ඉල්ලුම් පත්‍රය එවිය යුත්තේ තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රාදේශීය බල මණ්ඩලයේ ප්‍රධානියාගේ මාර්ගයෙනි. ඉල්ලුම් පත්‍ර එවීමේදී මෙම ක්‍රියා මාර්ගය අනුගමනය නොකරන අපේක්ෂකයෙකු වෙතොත්, ඔහු විභාගයට සුදුසුකම් නැත්තකු ලෙස සළකනු ලැබේ.

(iii) ලියවිලිවල පිටපත් මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා නොඑවිය යුතුයි.

(iv) මේ විභාගයේ රෙගුලාසිවලට අනුව යම් අපේක්ෂකයෙකු විභාගයට පෙනී සිටීමට නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ සේ සළකනු ලැබේ. යම් අපේක්ෂකයකු දැන දැනම අසත්‍ය තොරතුරු පළකොට තිබෙන බව පෙනී ගියහොත් හෝ යම්කිසි අවශ්‍ය කරුණක් කැමැත්තෙන්ම සඟවා තිබුණහොත් හෝ විභාගයට පෙනීසිටියේ නුසුදුස්සෙකු හැටියට බව සේවා කාලයේ කවර අවස්ථාවකදී වුවද හෙළි වුවහොත් ඔහු වහාම සේවයෙන් නෙරපනු ලැබීමට ඉඩ තිබේ.

2–1082—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

# අතුරු ව්‍යවස්ථා

එල්.ජී.—බී. 23/64.

## දන්කොටුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 සහ 156 වන වගන්ති යටතේ දන්කොටුව සුළු නගර සභාව විසින් සම්පාදිතව 153 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 8,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

සභාව විසින් පිළිගනු ලැබූ වාහන හා සතුන් පිළිබඳ බද්දට අදාළ වන සම්මත අතුරු ව්‍යවස්ථාවන්හි කාර්‍යය සඳහා පහත සඳහන් හඳුනා ගැනීමේ අක්ෂර පහත දැක්වෙන වාහන සඳහා විය යුතු ය:—

| | | |
|---|---|---|
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක්, හෝ බයිසිකල් කාර් එකක් හෝ කරත්තයක්, හෝ ට්‍රයිසිකල් කාර් එකක් හෝ කරත්තයක් සඳහා— | | |
| (අ) වෙළඳ කටයුතු සඳහා පාවිච්චි කරනු ලැබේ නම් | ... | ද.වෙ.බ. |
| (ආ) වෙළඳ කටයුතු හැර වෙන දෙයක් සඳහා පාවිච්චි කරනු ලැබේ නම් | ... | ද.බ. |
| ගොන් දෙන්නා බඳින සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා | ... | ද.ක. |
| තනි ගොනා බඳින සෑම බර බාගයක් හෝ තිරික් කලයක් සඳහා | ... | ද.ත.ක. |
| සෑම අත් කරත්තයක් සඳහා | ... | ද.අ.ක. |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා | ... | ද.රි. |

2–1105—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

ඇල්.ජී.—බී. 3/53.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ බෙරලපනාතර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව, එම වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා කෙරෙහි පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 1. 27,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

බෙරලපනාතර ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව 1956 ක්වූ මාර්තු මස 23 වැනි දින අංක 10,905 දරන ගැසට් පත්‍රයේ පළවූ අතුරු ව්‍යවස්ථා මාලාවේ අන්තරාදායක සහ අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) 1 වැනි ඡේදයෙහි අවසාන කරුණට ඉක්බිතිවම පහත සඳහන් අළුත් කරුණු එකතු කිරීමෙන්:—

"මෝටර් රථ ගරාජයක් තබාගැනීම,
තේ පෙට්ටි සාදන ස්ථානයක් පවත්වාගෙන යෑම,
ගෘහ භාණ්ඩ තැනීම,
බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යෑම,
ටයර් හා ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් තබා ගැනීම" සහ

(2) 2 වැනි ඡේදයෙහි අන්තිම කාරණයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් කරුණ එකතු කිරීමෙන්:—

"සුරුට්ටු නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම."

2–1106—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

ඇල්.ජී.—බී. 40/50

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වන වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ හොරොම්බාව ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වන උප වගන්තිය යටතේ පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970.1.27 වන දින.
කොළඹ දී ය.

### අතුරු ව්‍යවස්ථාව

1964 ජනවාරි 24 වන දින අංක 13,931 දරන ගැසට් පත්‍රයෙහි පළ කරන ලද අප්‍රසන්න හා අන්තරායදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා—

එහි 1 වන අතුරු ව්‍යවස්ථාව අගට

(1) "10. බයිසිකල් අලුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම
11. මෝටර් ගරාජයක් තබා ගැනීම,
12. මෝටර් වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් තබා ගැනීම,
13. පොල්ලෙලි වළක් තබා ගැනීම"

යන ව්‍යාපාර ඇතුළත් කිරීමෙන් සහ

(2) එහි 1 වන අතුරු ව්‍යවස්ථාව අගට

"17. ලී වෙළඳසැලක් තබා ගැනීම" යන ව්‍යාපාරය ඇතුළත් කිරීමෙන්ද සංශෝධනය කරනු ලැබේ.

2–1116—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

ඇල්.ජී.—බී. 136/47

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ මහනුවර දිස්ත්‍රික්කයේ පාත හේවාහැට ගන්දහය දකුණ අංක 1 දරන ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් පනවනු ලැබ එකී වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාවයි.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 8 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

## මලමූත්‍ර ඉවත් කිරීමේ ගාස්තුව

පාත හේවාහැට ගන්දහය දකුණ අංක 1 දරණ ගම්සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල VI වැනි කොටසේ 6 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යන් සඳහා සභාවට ගෙවියයුතු මල මූත්‍ර ඉවත් කිරීමේ ගාස්තුව මාසයකට එක් එක් බාල්දිය සඳහා රුපියල් දෙකක් විය යුතුය.

2–1099—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

ඇල්.ඞී.—බී. 15/68.

## රුගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 152 වැනි සහ 156 වැනි වගන්ති යටතේ රුගම සුළු නගර සභාව විසින් පනවනු ලැබ, එකී ආඥාපනතේ 153 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1969.9.12 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

රුගම සුළු නගර සභාව විසින් පිළිගන්නා ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XXII වැනි කොටසෙහි 3 වෙනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වාහන වෙන්කොට දක්වීමේ අකුරු පහත සඳහන් පරිදි විය යුතුය :—

මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම වාහනයකට ... රු. සු. වා.

ඕනෑම පාපැදියක් හෝ රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්ත යක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්—

(අ) වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... රු. සු. බ. වෙ.

(ආ) වෙළඳ කාර්යයන් හැර වෙන ඕනෑම කටයුත්තක් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... රු. සු. බ.

ඕනෑම අන් දමක ගොන් දෙන්නා බඳින කරත්තයකට ... ... රු. සු. බ. ක.

ඕනෑම අන් දමක තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලයකට ... රු. සු. ක.

ඕනෑම අන් කරත්තයකට ... ... රු. සු. අ.

2-1107—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඞී.—බී 79/47.

## නුවරඑළි දිස්ත්‍රික්කයේ රම්බොඩ කෝරලේ ගම් සභාව

### ගම් සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම් සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ, නුවරඑළි දිස්ත්‍රික්කයේ රම්බොඩ කෝරලේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් සම්පාදිතව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.2.8 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථාව

නුවරඑළි දිස්ත්‍රික්කයේ රම්බොඩ කෝරලේ ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පිළිගන්නා ලද, වෙළඳ පොළවල් හා පොළවල්වලට අදාළ සම්මත අතුරු ව්‍යවස්ථාවල XXVII වැනි කොටසේ 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ කාර්යය සඳහා කටුකිතුල වෙළඳ පොළට වෙන් කෙරෙන වෙළඳ පොළ ප්‍රදේශය, එකී වෙළඳ පොළේ සිට සැතපුම් භාගයක අර්ධ විෂ්කම්භයක් ඇති වෘත්තයක් ඇතුළත වූ ප්‍රදේශය විය යුතුය.

2-1100—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ මාරපන ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඊ. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්.

1970 පෙබරවාරි 8 වැනි දින,
කොළඹදීය.

### අතුරු ව්‍යවස්ථා

### ගොඩනැගිලි සහ මායිම් තාප්ප

1. කිසිවකු විසින් ගම්ප්‍රදේශයේ ඇතුළත—

(අ) යම් ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි පනලොවක දුර ප්‍රමාණය ;

(ආ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත්කරනු ලැබිය හැකි යයි සභාව විසින් දැනුම් දෙනු ලැබුවාවූ යම් ගම්බද මාවතක් මැද සිට අඩි පනලොවක දුර ප්‍රමාණය ඇතුළත, හෝ

(ඇ) මේ අතුරු ව්‍යවස්ථාවේ (ආ) උප වගන්තියේ සඳහන් කරන ලද මාවතකින් බාහිරවූ යම් ගම්බද මාවතක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත

කිසියම් අළුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ඉදි නොකළ යුතුය.

2. අවු ගණනේ දවස් තිහකටවත් කලින් ඒ පිළිබඳව ලියවිල්ලකින්වූ දැන්වීමක් සභාපතිට භාර නොකර කිසිවකු විසින් (1) අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරන ලද යම් කරත්ත පාරක් හෝ මාවතක් අසියේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් ඉදි නො කළ යුතුය.

### දඩාවතේ යන ගවයන්

3. සභාව විසින් සම්මත කර ගන්නා ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 24 වැනි කොටසේ 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ (1) වැනි ඡේදය යටතේ, දඩාවතේ යන සතුන් දමන කොටුවේ දමන ලද යම් සතකු ඉන් ඉවත්කර ගෙන යාමට මත්තෙන් අයකළ යුතුවූ ගාස්තුව පහත දක්වෙන සේ ගණන් බලා අයකළ යුතුය :—

(අ) සතුන් දමන කොටුවට ඇතුල් කළ එක් සතෙකුට රුපියල් දෙකයි ශත පණහක්.

(ආ) ඉහත සඳහන් අය කිරීමට අමතර වශයෙන්—

(1) සතුන් දමන කොටුවෙහි දමන ලද එක් එක් සතෙකුට එක් රැයක් සඳහා රුපියල් දෙක බැගින් සහ

(2) දහවල් කාලයේ කොටුකර හෝ බැඳ තබන ලද එක් සතෙකුට ශත පණහක් බැගින්.

### මහජන හිරිහැර අඩු කිරීම

4. ගම් ප්‍රදේශය තුළ කිසිවකු විසින් යම් ග්‍රැමපෝන් යන්ත්‍රයක් හෝ ගුවන් විදුලි යන්ත්‍රයක් හෝ ශබ්ද වාහිණී යන්ත්‍රයක් හෝ වෙනත් එබඳු යන්ත්‍රයක් ක්‍රියාකරවීමෙන් හෝ ක්‍රියාකරවීමට සැලැස්වීමෙන් හෝ වෙනත් කෙනෙකුට ක්‍රියාකරවීමට ඉඩදීමෙන් අහල පහල පිහිටි ඉඩම්වල පදිංචි කාරයින්ට කන්දෙස් ක්‍රියාවක් සිදුවන පරිද්දෙන් අධික ලෙස හෝ නැවත නැවතත් හෝ නොර තෝංචියක් නැතිව හෝ යම් ශබ්දයක් ඇති කිරීම හෝ නැවත උපදවීම හෝ ඇති කිරීමට හෝ නැවත උපදවීමට සැලැස්වීම හෝ නොකට යුතුයි.

5. යම්කිසි වීථියක්, පොදු ස්ථානයක්, කඩයක් හෝ වෙළඳාම කරන ස්ථානයක් හෝ මහජනයා පැමිණෙන්නාවූ යම් වීථියක් නැතහොත් පොදු ස්ථානයක් අසල පිහිටියාවූ යම් ස්ථානයක් යන මෙකී ස්ථානවලින් බාහිරවූ යම් ස්ථානයක ඉහත සඳහන් පරිදි යම් යන්ත්‍රයක් ක්‍රියාකරවන්නාවූ හෝ වෙනත් ක්‍රියා කරවීමට සලස්වන්නාවූ හෝ වෙනත් කෙනෙකුට ක්‍රියා කරවීමට ඉඩ දෙන්නාවූ යම් කිසිවෙකුට විරුද්ධව—

(අ) එය කන්දොස්ක්‍රියාවක්ය කියා ඒ අසල පිහිටි ගෙවල්වල පදිංචිව සිටින ගෘහමූලිකයන් තුන් දෙනෙකුට නොඅඩු ගණනක් විසින් ඒ බව ලියවිල්ලකින් සභාපතිට පැමිණිලි කරනු ලැබ;

(ආ) සභාපති විසින් තමාට ලැබුණු පැමිණිලිවල ස්වභාවයන් දක්වා ලියවිල්ලකින් ඒ අයට වහාම හෝ නියමිත කාල සීමාවක් ඇතුළතදී හෝ ඒ කන්දොස්ක්‍රියාව අඩුකළ යුතුයයි නිවේදනයක් කරනු ලැබ; හා

(ඇ) අවස්ථාවෝචිතව ඒ දැන්වීම ලැබුන හැටියේම හෝ එහි සඳහන් කාලසීමාව ඇතුළත දී හෝ ඒ අය විසින් එහි දක්වෙන නියමයන් ඉෂ්ට නොකර හෝ ඉෂ්ට කිරීම පැහැර හැර තිබේ නම් මිස

4 වැනි ව්‍යවස්ථාව යටතේ නඩු පැවරිය යුතු නැත.

### නිලධාරීන් හා සේවකයින්

6. සභාවට ලැබිය යුතු සියළුම අයබදු හෝ ගාස්තු එකතු කොට සභාවේ මුද්‍රාව හා සභාපතිගේ ප්‍රතිරූප අත්සන දරන මුද්‍රිත කුවිතාන්සි නිකුත් කිරීමට සභාපති විසින් යම් නිලධාරියකුට හෝ වෙනත් කෙනකුට ලියවිල්ලකින් බලය පැවරිය හැකිය.

7. කිසිවකු විසින්—

(අ) ගම්සභා ආඥාපනතෙන් හෝ එය යටතේ සාදන ලද යම් අතුරු ව්‍යවස්ථාවල යම් විධි විධානයක් යටතේ හෝ සභාපති හෝ සභාවේ වෙනත් යම් නිලධාරියකු වෙත පවරා ඇති යම් බලයක් පාවිච්චි කිරීමේදී හෝ පනවා ඇති යම් යුතුකමක් ඉටු කිරීමේදී හෝ නියම කොට ඇති යම් කාර්යයක් ක්‍රියාවේ යෙදවීමේදී එකී සභාපතිට හෝ නිලධාරියාට; හෝ

(ආ) සභාව විසින් හෝ සභාව වෙනුවෙන් හෝ සේවයේ යොදවන ලද යම් සේවකයකුට හෝ කම්කරුවකුට සභාපති විසින් හෝ සභාවේ වෙනත් යම් නිලධාරියකු විසින් හෝ නීති ප්‍රකාර පවරා තිබෙන යම් යුතුකමක් ඒ සේවකයා හෝ කම්කරුවා හෝ විසින් ඉටු කිරීමේදී ඔහුට

ඕනෑකමින් බාධා නොකළ යුතුයි.

8. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපති අදහස් කරනු ලැබේ.

"සභාව" යනුවෙන් ගම්ප්‍රදේශයේ ගම්සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපනත" යනුවෙන් ගම්සභා ආඥාපනත අදහස් කරනු ලැබේ.

"ගම්ප්‍රදේශය" යනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ මාරපන ගම්සභා ප්‍රදේශය අදහස් කරනු ලැබේ.

2–1098—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ජී.—බී. 12/47.

### ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වගන්තිය යටතේ මාතර දිස්ත්‍රික්කයේ නාවිමන-මාකවිට ගම් ප්‍රදේශයේ ගම් සභාව විසින් පනවනු ලැබ, ඒ වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, පළාත් පාලන ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ටී. ජී. ගුණවර්ධන,
පළාත් පාලන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970.2.8 දින,
කොළඹ දීය.

**ගොඩනැගිලි සහ මායිම් තාප්ප ඉදිකිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

1. (1) කිසිම තැනැත්තෙකු විසින් ගම් ප්‍රදේශය තුළ—

(අ) ගම්බද කරත්ත පාරක් මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ආ) යථා කාලයේදී ගම්බද කරත්ත පාරක් බවට පත් කරනු ලැබිය හැකි යයි සභාව විසින් ප්‍රකාශයට පත්කොට ඇති අඩි පාරක් මැද සිට අඩි විස්සක දුර ප්‍රමාණයක් ඇතුළත, හෝ

(ඇ) (ආ) ඡේදයෙහි සඳහන් අඩි පාරකින් බාහිර වූ යම් ගම්බද අඩි පාරක් මැද සිට අඩි හතක දුර ප්‍රමාණයක් ඇතුළත

අලුත් ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් නොසෑදිය යුතුයි.

(2) ලියවිල්ලකින් වූ දැන්වීමකින් අඩු ගණනේ දවස් තිහකට කලින්වත් ඒ පිළිබඳව සභාපති වෙත දැනුම් නොදී කිසිම තැනැත්තෙකු විසින් (1) වැනි ඡේදයෙහි සඳහන් කරන ලද යම් කරත්ත පාරක් හෝ අඩි පාරක් අයිනේ කිසිම ගොඩනැගිල්ලක්, මායිම් තාප්පයක් හෝ ගේට්ටුවක් නොසෑදිය යුතුයි.

2. මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යන්නෙන් සභාවේ සභාපති අදහස් වේ.

"සභාව" යන්නෙන් මාතර දිස්ත්‍රික්කයේ නාවිමන-මාකවිට ගම් ප්‍රදේශයේ ගම්සභාව අදහස් වේ.

තවද,

"ගම් ප්‍රදේශය" යනුවෙන් නාවිමන-මාකවිට ගම්සභාවේ ගම් ප්‍රදේශය අදහස් වේ.

2–1108—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## අය-වැය ලේඛන

### කැළණිය සුළු නගර සභාව

**අංක 40 (II) දරණ සුළු නගර සභා මුදල් රෙගුලාසි යටතේ කෙරෙන ඉල්ලීමයි**

### 1969 අය–වැය ලේඛනය

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදනයන් සඳහා 1969 වාර්ෂික වැය සම්මතයන්ගෙන් ඉතිරි වේ යයි ගණන් බලන ලද මුදල් බටහිර කොට්ඨාශයේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් අනුමැතියට යටත්ව යෙදීමට 1969 නොවැම්බර් මස 29 වන දින පවත්වන ලද සභා රැස්වීමේදී අංක 6 දරණ සභා සම්මතයෙන් තීරණය විය.

**සාමාන්‍ය අංශය**

| ඉතිරි කරගත් ශීර්ෂ | | රු. | ශ. | වැඩිපුර වැය වූ ශීර්ෂ | | රු. | ශ. |
|---|---|---|---|---|---|---|---|
| බී.—7. | ... | 50 | 0 | ඒ.—1. (ඒ) | ... | 900 | 0 |
| බී.—13. | ... | 8,000 | 0 | ඒ.—1. (බී) | ... | 3,000 | 0 |
| ඩී.—1. (ඇෆ්) | ... | 2,500 | 0 | ඒ.—1. (සී) | ... | 550 | 0 |
| ඩී.—2. (ඊ) | ... | 3,000 | 0 | ඒ.—2. (සී) | ... | 2,645 | 0 |
| ඩී.—3. (ඒ) | ... | 2,000 | 0 | ඒ.—2. (ඊ) | ... | 6,500 | 0 |
| ඩී.—3. (එච්) | ... | 10,000 | 0 | ඒ.—2. (ඇෆ්) | ... | 500 | 0 |
| | | | | ඒ.—2. (එච්) | ... | 1,000 | 0 |
| | | | | ඒ.—2. (ජේ) | ... | 100 | 0 |
| | | | | බී.—1. (බී) | ... | 350 | 0 |
| | | | | සී.—1. | ... | 800 | 0 |
| | | | | සී.—4. | ... | 1,000 | 0 |
| | | | | ඩී.—1. (ඒ) 1. | ... | 550 | 0 |
| | | | | ඩී.—2. (ඒ) | ... | 1,000 | 0 |
| | | | | ඩී.—3. (බී) | ... | 500 | 0 |
| | | | | ඩී.—6. (ඒ) | ... | 1,300 | 0 |
| | | | | ඩී.—6. (බී) | ... | 2,500 | 0 |
| | | | | ජේ.—1. | ... | 350 | 0 |
| | | | | ඒ.—1. (ඇෆ්) | ... | 1,000 | 0 |
| | | | | ඒ.—1. (අයි) | ... | 465 | 0 |
| | | | | බී.—14. | ... | 100 | 0 |
| | | | | සී.—9. | ... | 50 | 0 |
| | | | | ඩී.—1. (කිව්) | ... | 50 | 0 |
| | | | | ඩී.—2. (ඇෆ්) | ... | 75 | 0 |
| | | | | ඩී.—3. (අයි) | ... | 100 | 0 |
| | | | | ඩී.—6. (ඊ) | ... | 165 | 0 |
| | | 25,550 | 0 | | | 25,550 | 0 |

II වන කොටස—විදුලි අංශය

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| වී.—1. (ඩී) | ... 2,380 0 | වී.—2. (සී) | ... 150 0 |
| වී.—4. (සී) | ... 1,500 0 | වී.—2. (ඩී) | ... 815 0 |
| වී.—8. | ... 25 0 | වී.—3. (ඒ) | ... 850 0 |
| වී.—10. | ... 3,400 0 | වී.—3. (බී) | ... 690 0 |
| වී.—6. | ... 7,350 0 | වී.—4. (ඒ) | ... 3,000 0 |
| | | වී.—4. (බී) | ... 3,700 0 |
| | | වී.—4. (ඩී) | ... 5,000 0 |
| | | වී.—11. | ... 450 0 |
| | 14,655 0 | | 14,655 0 |

ඩබ්. කේ. ඩී. සිරිසේන,
සභාපති,
කැළණිය සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
කැළණිය,
1969.12.31

අනුමත කරමි.

පළාත් පාලන සහකාර කොමසාරිස්.
(බටහිර කොට්ඨාශය)

1970.2.7 දින.
කොළඹ දීය.

2–1097—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## ජාඇල නගර සභාව

### ජලභීතිකා රෝගය

ජාඇල නගර සීමාව තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමා තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක බැඳ නොතබනු ලද්දා වූ හෝ දක්කාගෙන නොයනු ලබන්නා වූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥා පනතේ 11 වන වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1970 පෙබරවාරි මස 25 වෙනි දින සිට මාස හයක් වලංගු වන්නේ ය.

ඇම්. ජෝශෙප් මයිකල් පෙරේරා,
සභාපති,
ජාඇල නගර සභාව.

1970 ක්වූ පෙබරවාරි මස 18 වැනි දින,
ජාඇල නගර සභා කායර්‍යාලයේ දීය.

2–1083—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## බේරුවල අලුත්ගම මාලෙවන්බදු ගම්සභාව—කලුතර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

මෙහි පහත උප ලේඛණයේ නම සඳහන් අය විසින් එහි දක්වෙන ස්ථාන යෙහි 1970 වර්ෂය සඳහා මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීම ගැන කලුතර දිස්ත්‍රික්කයේ බේරුවල අලුත්ගම මාලේවන්බදු ගම්සභා සීමාව තුළ පදිංචි ඕනෑම කෙනෙකුගේ විරුද්ධත්වයක් ඇත්නම්, එය විස්තර සහිත ලියවිල්ලකින් පිටපත් දෙකකින් යුක්ත වන සේ සකස් කොට මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ සංශෝධිත ආඥපනතේ 272 වෙනි පරිච්ඡේදයෙහි 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | වෙළඳාම |
|---|---|---|
| ඒ. ආර්. අබ්දුල් සවාඩ්, අංක 139, අලුත් පාර, දර්ගා නගරය | වරාපිටියේ කුරුඳුවත්තේ පිහිටි කුරුඳුවත්ත නමැති ඉඩම | එළ හරක් මස් |

එච්. ඇස්. ද සිල්වා,
බේරුවල අලුත්ගම මාලෙවන්බදු ගම්සභාවේ සභාපති.

1970 පෙබරවාරි 15 වෙනි දින,
ගම්සභා කායර්‍යාලය,
කලුවාමෝදර, අලුත්ගම.

2–1114—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## පොල්ගහවෙල සුළු නගර සභාව

### 1970 වරිපනම් ලේඛන

1970 සඳහා මෙම සුළු නගර සභාවේ වරිපනම් ලේඛන සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාලීය වේලාවන්හිදී පරීක්ෂා කර බැලීම සඳහා තබා ඇති බවත්, 256 වැනි අධිකාරය වූ සුළු නගර සභා ආඥපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි, 252 වැනි අධිකාරය වූ මහ නගර සභා ආඥපනතේ අංක 235 (1) දරණ වගන්තිය අනුව මෙසේ දැනුම් දෙනු ලැබේ.

ජේ. ඒ. මුතුබණ්ඩා,
සභාපති,
සුළු නගර සභාව, පොල්ගහවෙල.

1970 පෙබරවාරි මස 18 වැනි දින,
පොල්ගහවෙල සුළු නගර සභා කාර්යාලයේදීය.

2–1086—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## රත්කොට සුළු නගර සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ අඥපනක

මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ (272 වැනි අධිකාරයේ) 17(I) දරණ වගන්තියෙන් මාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියමිත අධිකාරී තැන වූ රත්කොට සුළු නගර සභාවේ සභාපති එන්. පී. එම්. අයි. ඉක්බාල් වන මම, 1970 වර්ෂයේදී පහත දක්වෙන උපලේඛනයේ සඳහන් දිනවල රත්තොට සුළු නගර සභා සීමාව තුල මස් පිණිස සතුන් මැරීම සහ මස් විකිණීමට හෝ මස් ප්‍රදර්ශණය කිරීම හෝ මස් කඩ විවෘතකර තැබීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

### උපලේඛනය

| | |
|---|---|
| 1970 පෙබරවාරි | ... 21, 28. |
| 1970 මාර්තු | ... 7, 15, 22, 30. |
| 1970 අප්‍රියෙල් | ... 6, 14, 21, 28. |
| 1970 මැයි | ... 5, 13, 20, 21, 28. |
| 1970 ජූනි | ... 4, 12, 19, 26. |
| 1970 ජූලි | ... 3, 11, 18, 25. |
| 1970 අගෝස්තු | ... 1, 9, 16, 23, 31. |
| 1970 සැප්තැම්බර් | ... 8, 15, 22, 29. |
| 1970 ඔක්තෝබර් | ... 4, 7. 14, 22, 29. |
| 1970 නොවැම්බර් | ... 6, 13, 21, 28. |
| 1970 දෙසැම්බර් | ... 5, 12, 20, 27. |

එන්. පී. එම්. අයි. ඉක්බාල්,
සභාපති,
රත්කොට සුළු නගර සභාව.

1970 පෙබරවාරි මස 15 වෙනි දින,
රත්තොට සුළු නගර සභා කාර්යාලයේදීය.

2–1112—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

## හාලිඇල සුළු නගර සභාව

### ගෝ ඝාතක ආඥාපනත. (272 වැනි අධිකාරය)

ගෝ ඝාතක ආඥා පනතේ (272 වැනි අධිකාරය) 17 (1) දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර නිසි බලධරයාවූද, හාලිඇල සුළු නගර සභාවේ සභාපති තැන වූද, දි. ර. ආ. ප්‍රේමදාස වන මම, 1970 වර්‍ෂය තුළදී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන දිනවල බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල සුළු නගර සභා සීමා ඇතුලත මස් පිණිස සතුන් මැරීම හෝ මස් විකිණීම පිණිස ප්‍රදර්‍ශනය කිරීම හෝ සම්පූර්ණයෙන්ම මෙයින් තහනම් කරමි.

දි. ර. ආ. ප්‍රේමදාස,
හාලිඇල සුළු නගර සභාවේ සභාපති.

1970 පෙබරවාරි මස 18 වෙනි දින,
හාලිඇල සුළු නගර සභා කාර්‍යාලයේදීය.

### උපලේඛණය

1970 ජනවාරි 7 වෙනි බදාදා. (අමාවක)
1970 ජනවාරි 22 වෙනි බ්‍රහස්පතින්දා. (පසලොස්වක)
1970 පෙබරවාරි 6 වෙනි සිකුරාදා. (අමාවක)
1970 පෙබරවාරි 21 වෙනි සෙනසුරාදා. (පසලොස්වක)
1970 මාර්තු 7 වෙනි සෙනසුරාදා. (අමාවක)
1970 මාර්තු 22 වෙනි ඉරිදා. (පසලොස්වක)
1970 අප්‍රේල් 6 වෙනි සඳුදා. (අමාවක)
1970 අප්‍රේල් 21 වෙනි අඟහරුවාදා. (පසලොස්වක)
1970 මැයි 5 වෙනි අඟහරුවාදා. (අමාවක)
1970 මැයි 20 වෙනි බදාදා. (පසලොස්වක)
1970 ජූනි 4 වෙනි බ්‍රහස්පතින්දා. (අමාවක)
1970 ජූනි 19 වෙනි සිකුරාදා. (පසලොස්වක)
1970 ජූලි 3 වෙනි සිකුරාදා. (අමාවක)
1970 ජූලි 18 වෙනි සෙනසුරාදා. (පසලොස්වක)
1970 අගෝස්තු 1 වෙනි සෙනසුරාදා. (අමාවක)
1970 අගෝස්තු 16 වෙනි ඉරිදා. (පසලොස්වක)
1970 අගෝස්තු 31 වෙනි සඳුදා. (අමාවක)
1970 සැප්තැම්බර් 15 වෙනි අඟහරුවාදා. (පසලොස්වක)
1970 සැප්තැම්බර් 29 වෙනි අඟහරුවාදා. (අමාවක)
1970 ඔක්තෝබර් 4 වෙනි ඉරිදා (ලෝක සත්ව දිනය)
1970 ඔක්තෝබර් 14 වෙනි බදාදා. (පසලොස්වක)
1970 ඔක්තෝබර් 29 වෙනි බ්‍රහස්පතින්දා. (අමාවක)
1970 නොවැම්බර් 13 වෙනි සිකුරාදා. (පසලොස්වක)
1970 නොවැම්බර් 28 වෙනි සෙනසුරාදා. (අමාවක)
1970 දෙසැම්බර් 12 වෙනි සෙනසුරාදා. (පසලොස්වක)
1970 දෙසැම්බර් 27 වෙනි ඉරිදා. (අමාවක)

2–1084—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

## කඳාන සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය) සුළු නගර සභා ආඥාපනතේ 161 වැනි හා 163 වැනි වගන්ති යටතේ කඳාන සුළු නගර සභාව විසින්, මෙහි පහත විස්තර කරන බලපත්‍ර සඳහා මීට යාකොට ඇති උපලේඛනයේ නිශ්චිතව සඳහන් බලපත්‍ර ගාස්තු 1970 ජනවාරි මස 1 වැනි දින සිට පනවා ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජෙරාඩ් බී. හල්පෙ,
සභාපති,
කඳාන සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්‍යාලය,
කඳාන,
69. 12. 14.

### උපලේඛනය

| බලපත්‍රයේ විස්තර | වාර්ෂික ගාස්තු රු. | ශ. |
|---|---|---|
| (1) කොප්පරා නිෂ්පාදනය කිරීම ... ... | 25 | 0 |
| (2) කොප්පරා ගබඩා කිරීම ... ... | 15 | 0 |
| (3) කබුක්ගල් හෝ බොරළු ලබා ගැනීමට වලවල් කැපීම ... ... | 15 | 0 |
| (4) කපාපු පොල් නිෂ්පාදනය කිරීම ... | 200 | 0 |
| (5) යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් සිඳීම ... | 150 | 0 |
| (6) තෙල් නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම ... ... | 150 | 0 |
| (7) පිදුරු ගබඩා කිරීම ... ... | 5 | 0 |
| (8) කෙඳි වර්ග තෙලීම හෝ ගබඩා කිරීම ... | 50 | 0 |
| (9) දර මඩුවක් පවත්වාගෙන යෑම ... | 10 | 0 |
| (10) ස්වර්ණාභරණ සෑදීම ... | 25 | 0 |
| (11) මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| (12) හාල් මෝලක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| (13) වී කෙටීම සඳහා වී කොටන යන්ත්‍රයක් හෝ ඇඹරුම් මෝලක් පවත්වාගෙන යෑම ... | 50 | 0 |
| (14) සිසිල් බීම කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යෑම ... ... | 100 | 0 |
| (15) තෙල් වලින් හෝ වෙනත් ඉන්ධනයකින් හෝ වාෂ්ප බලයෙන් හෝ විදුලි බලෙන් ක්‍රියාකරන යන්ත්‍ර පාවිච්චි කරන යම් ව්‍යාපාරයක් සඳහා... | 50 | 0 |
| (16) ලී මඩුවක් පවත්වාගෙන යෑම සඳහා ... | 100 | 0 |
| (17) කම්හලක් හෝ ආචාරී පට්ටලයක් පවත්වාගෙන යෑම ... ... | 5 | 0 |
| (18) ලීබඩු සෑදීම සඳහා ... ... | 15 | 0 |
| (19) ගරාජයක් පවත්වාගෙන යෑම ... ... | 50 | 0 |
| (20) මෝටෝ සයිකල් හෝ මෝටර් වාහන අළුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම ... ... | 50 | 0 |
| (21) බයිසිකල් අළුත්වැඩියා කරන වැඩපලක් සඳහා ... | 5 | 0 |
| (22) ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම සඳහා ... | 30 | 0 |
| (23) අළුත් ලෝහ ගබඩා කිරීම ... ... | 25 | 0 |
| (24) පුළුන් ගබඩා කිරීම ... ... | 20 | 0 |
| (25) ෂීට් රබර් හෝ ක්‍රෙප් රබර් සකස් කිරීම ... | 25 | 0 |
| (26) රබර් නිෂ්පාදනය කිරීම ... ... | 25 | 0 |
| (27) අම්ලකර පැස්සීම කම්හල් වැඩ කරනු ලබන යම් ව්‍යාපාර ... ... | 50 | 0 |
| (28) ගිනි පෙට්ටි සෑදීම ... ... | 150 | 0 |
| (29) ලියවන පට්ටලයක් පාවිච්චි කරනු ලබන යම් වැඩ පළක් පැවැත්වීම ... ... | 25 | 0 |
| (30) මාළු විකිණීම සඳහා ... ... | 50 | 0 |
| (31) මාළු ලුණු දැමීම හෝ කරවල වලට වේලීම ... | 10 | 0 |
| (32) කරවල හොණ්ඩර තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම ... ... | 50 | 0 |
| (33) ජාඩි හොණ්ඩර තුනකට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීමට ... ... | 50 | 0 |
| (34) තොග ගණනේ විකිණීම සඳහා නරක්වන ආහාර ද්‍රව්‍ය ගබඩාකර තැබීම ... ... | 200 | 0 |
| (35) විනාකිරි සෑදීම ... ... | 15 | 0 |
| (36) පුවක් වියළා සකස් කිරීම ... ... | 25 | 0 |
| (37) සතුන්ගේ හම් ගබඩා කිරීම ... ... | 100 | 0 |
| (38) සතුන්ගේ ඇට කටු ගබඩා කිරීම ... | 100 | 0 |
| (39) මාළු අයිස් දැමීම ... ... | 50 | 0 |
| (40) ලෑලි පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම | 50 | 0 |
| (41) සෝඩා සෑදීම සඳහා ... ... | 25 | 0 |
| (42) මිනී පෙට්ටි කඩයක් පවත්ගෙන යෑම ... | 20 | 0 |
| (43) සුරුට්ටු සෑදීම ... ... | 50 | 0 |
| (44) රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම ... | 150 | 0 |
| (45) බීඩි සෑදීම ... ... | 100 | 0 |
| (46) පෝර සෑදීම ... ... | 25 | 0 |
| (47) හම් පදම් කරන ස්ථානයක් පවත්වා ගෙන යෑම | 50 | 0 |
| (48) සතුන් ගේ ලේ හෙ අතුනු බහන් උණු කිරීම ... | 50 | 0 |
| (49) සබන් සෑදීම ... ... | 200 | 0 |
| (50) කෘතිම පෝර සෑදීම ... ... | 50 | 0 |
| (51) පොල්ලෙලි සකස් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම ... ... | 50 | 0 |
| (52) දුම්කොළ වියලීම හෝ සකස් කිරීම ... | 25 | 0 |
| (53) කෙඳි සායම් කිරීම ... ... | 50 | 0 |
| (54) ගඩොල් හෝ උළු පිළිස්සීම ... ... | 100 | 0 |
| (55) බැටරි පිරවීම සඳහා ... ... | 25 | 0 |
| (56) මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම ... | 25 | 0 |
| (57) හුණු පිළිස්සීම හෝ ගබඩා කිරීම ... | 25 | 0 |
| (58) තේ හෝ කෝපි කඩයක් පැවැත්වීම ... | 15 | 0 |
| (59) බත් කඩයක් පැවැත්වීම ... ... | 30 | 0 |
| (60) බේකරියක් පැවැත්වීම ... ... | 35 | 0 |
| (61) ලොන්ඩරියක් පැවැත්වීම ... | 25 | 0 |
| (62) බාබර් සාප්පුවක් (කරණවැමිහලක්) පැවැත්වීම | 25 | 0 |
| (63) සිල්ලර කඩයක් පැවැත්වීම ... ... | 10 | 0 |
| (64) කිරි පට්ටියක් (එක්කෙකුට වැඩි පහකට අඩු) ... | 25 | 0 |
| කිරි පට්ටියක් (පහකට වැඩි දහයකට අඩු) ... | 30 | 0 |
| කිරි පට්ටියක් (දහයකට වැඩි) ... | 50 | 0 |

2–1095—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

## වැලිගම නගර සභාව

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛණය

මහ නගර සභා ආඥාපණත (252 වන අධිකාරය) යටතේ සඳහන් 235 (1) දරණ වගන්තිය අනුවත්, නගර සභා ආඥාපණතේ (255 වන අධිකාරය) 166 වන වගන්තියෙන් කියවෙන ප්‍රකාරත්, මෙම නගර සභාවේ 1970 වර්ෂය සඳහා වූ වරිපනම් ලේඛණ දැනට සූදානම්ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන්හිදී මෙම කාර්යාලයේදී පරීක්ෂා කර බැලීම පිණිස තබා ඇති බවත් මෙයින් දැනුම් දෙමි.

හෙන්රි දළුවත්ත,
සභාපති,
නගර සභාව, වැලිගම.

1970 ක්වූ පෙබරවාරි මස 10 වැනි දින,
වැලිගම නගර සභා කාර්යාලයේදීය.

2–1111—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## දකුණු විලච්චිය කෝරලේ ගම්සභාව—අනුරාධපුර දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත විස්තර දක්වෙන උපලේඛනයෙහි සඳහන් අයවලුන් විසින් 1970 වර්ෂයට එළ හරක් මස් කඩ දෙකක් පවත්වා ගෙන යාමට බලපත්‍ර ඉල්ලුම් කර සිටින බවත් ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීමට දකුණු විලච්චිය කෝරලේ නොච්චියාගම ගම් ප්‍රදේශයේ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක් මෙම දැන්වීම ගැසැට් පත්‍රයේ පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වෙනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතේ සංශෝධිත අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩබ්. අප්පුහාමි,
දකුණු විලච්චිය කෝරලේ ගම් සභාපති.

ගම්සභා කාර්යාලය,
නොච්චියාගම,
70.2.15 වෙනි දින.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. ඇස්. ජෙනුල්ලාබදීන් | ... එළ හරක් මස් | ... නොච්චියාගම අංක 17 දරණ ස්ථානය |
| 2. ඒ. ඇම්. මජීදු | ... එළ හරක් මස් | ... නොච්චියාගම අංක 16 දරණ ස්ථානය |

2–1110—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

---

## තෙල්දෙනිය නගරය

### 1970 වර්ෂයේ වරිපනම් ලේඛනය

1970 වර්ෂය සඳහා තෙල්දෙනිය නගරයේ වරිපනම් ලේඛන දැනට සූදානම් ව ඇති බවත්, එම ලේඛන කාර්යාල වේලාවන් හි දී මහජනයාට පරීක්ෂාකර බැලීම සඳහා තබා ඇති බවත් (256 වැනි අධිකාරය වන) සුළු නගරසභා ආඥාපනතේ 165 වැනි වගන්තියෙන් කියවෙන පරිදි (252 වැනි අධිකාරය වන) මහ නගරසභා ආඥාපනතේ 235 (1) දරණ වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

ලී. මු. සමරසිංහ,
විශේෂ කොමසාරිස්,
තෙල්දෙනිය නගරය

1970 පෙබරවාරි මස 16 වැනි දින,
තෙල්දෙනිය විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

2–1078—70.2.27 දින අංක 14,895 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳ වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් විනු ඇත

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය

### උපලේඛනය

**1970**

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජනවාරි | ... | 70. 1. 2 සිකුරාද | ... | 69.12.26 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1. 9 සිකුරාද | ... | 70. 1. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 1.16 සිකුරාද | ... | 70. 1. 8 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 1.23 සිකුරාද | ... | 70. 1.16 සිකුරාද | දවල් | 12.00 |
| | | 70. 1.29 බ්‍රහස්පතින්ද | ... | 70. 1.21 බදාද | දවල් | 12.00 |
| පෙබරවාරි | ... | 70. 2. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 1.28 බදාද | ප.ව. | 3.30 |
| | | 70. 2.13 සිකුරාද | ... | 70. 2. 5 බ්‍රහස්පතින්ද | දවල් | 12.00 |
| | | 70. 2.20 සිකුරාද | ... | 70. 2.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 2.27 සිකුරාද | ... | 70. 2.20 සිකුරාද | දවල් | 12.00 |
| මාර්තු | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ... | 70. 2.27 සිකුරාද | දවල් | 12.00 |
| | | 70. 3.13 සිකුරාද | ... | 70. 3. 5 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 3.20 සිකුරාද | ... | 70. 3.13 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 3.26 බ්‍රහස්පතින්ද | ... | 70. 3.20 සිකුරාද | ප.ව. | 3.30 |

1969 දෙසැම්බර් මස 12 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

එල්. ඩබ්ලිව්. සී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.